# ☭ නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

ISSN 1391 - 1031
2019 දෙසැම්බර්
25 වෙළුම 07 කලාපය

ආධාරය රු 40/=

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී


"...අපි මුලපිරීම පටන් ගනිමු. කවර කාලයක් තුළ කුමන නිර්ධන පංතිය විසින් එම ක්‍රියාදාමය අවසන් කරන්නේද යන්න වැදගත් නොවේ. වැදගත් වන්නේ අයිස් තට්ටුව කඩා දමා පාර එළිපෙහෙළි කොට මාර්ගය විවෘත කර තැබීමය..."

**වී. අයි. ලෙනින්**

තෝ.කෘ. 12 පිටුව
41 පිටුව




# 'අලුත්' ආණ්ඩුව දඩයම අරඹයි
# මර්දනයට එරෙහිව සටන් වදින්න ජ.වි.පෙ. සූදානම්

**නව ජනාධිපතිවරයා ප්‍රමුඛ රාජපක්ෂ ආණ්ඩුව පත්වූ විගසම අනතුරුදායක සංඥා රටට නිකුත් කරමින් සිටින බවටත් සිදුවීම් කිහිපයකින්ම ආණ්ඩුවේ මර්දන යන්ත්‍රයේ සෙවණැලි සමාජය මත වැටෙමින් ඇති බවටත් ජනතාවට අනතුරු හඟවා සිටි ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා, මෙම තත්වයට එරෙහිව ජනතාවගේ පාර්ශ්වයේ සිට සටන් වැදීමට ජ.වි.පෙ. පසුබට නොවන බව අවධාරණය කළේය.**

සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා මෙම අදහස් පළ කළේ රට තුළ වර්ධනය වන නව තත්වය පිළිබඳ ජ.වි.පෙ. ස්ථාවරය පැහැදිලි කිරීම සඳහා පසුගිය 29වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවේදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ හඳුන්නෙත්ති සහෝදරයා මෙසේද ප්‍රකාශ කළේය.

"අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානී ශානි අබේසේකර තනතුරෙන් පහතට දමා දකුණට මාරු කිරීම, නිශාන්තද සිල්වාට රට හැරයාමට සිදුවූ සිදුවීම්, සාමජ මාධ්‍ය ජාලාවලට කරන මර්දන හා බලපෑම්, ස්විස්ටර්ලන්ත තානාපති කාර්යාලයේ නිලධාරිනියගේ පැහැරගෙන යෑම ආදී 'පුදනකොටම කාපි යකා' වර්ගයේ සිද්ධීන්වලින් නැවත වතාවක් සුදු වෑන් සංස්කෘතියේ හා රාජපක්ෂ මර්දන යන්ත්‍රයේ සෙවනැලි සමාජය මත පතිත වෙමින් පවතින බව පෙන්වා දෙනවා.

මේ ජනාධිපතිවරයා බලයට ඒම සඳහා පාවිච්චි කළ ප්‍රධාන සටන් පාඨය ජාතික ආරක්ෂාව හා සුරක්ෂිත රටක් කියන එක. ජනතාව දුන්න ජනවරම අපි පිළිගන්නවා. නමුත් මේ ජනවරම ලැබුණේ පාලකයන්ට තමන් ගැන පරීක්ෂණ කරන අයව බිය ගන්වලා, මර්දනය කරලා තමන්ට හිතවත් අය අදාළ තනතුරුවලට පත්කිරීමටවත් තමන්ට එරෙහි පරීක්ෂණ යට ගහන්නවත් නොවේ. මෙතරම් ඉක්මනට සුදු වෑන් සංස්කෘතිය නැවත හොල්මන් කරාවි කියලා මේ පාලකයා බලයට ගේන්න මහන්සි වූ ආගමික නායකයෝවත් ඡන්දය දුන් ජනතාවවත් හිතන්න නැතිව ඇති.

තමන්ට තිබෙන චෝදනා ගැන පරීක්ෂණ කරන නිලධාරීන් මර්දනය, සාක්ෂි විකෘති කිරීම, සාක්ෂි ඉල්ලා අස්කර ගැනීමට බලකර එසේ ඉල්ලා අස්කර ගැනීමට සැලැස්වීම දැනටමත් මේ පාලකයෝ පටන් අරන්. රට හැර යාමට සිද්ධ වූ හා ස්ථාන මාරුවට ලක්වූ නිලධාරීන් පසුගිය රාජපක්ෂ ආණ්ඩුවේ මෙන්ම එජාප ආණ්ඩුවේද මහා පරිමාණ වංචා-දූෂණ ගැන පරීක්ෂණ කළ අය. දැන් හොරු ගැන පරීක්ෂණ කිරීම පැත්තක තියලා ඔවුන් ගැන පරීක්ෂණ කරන නිලධාරීන්ගෙන් පලිගන්න පටන් අරන්. දැන් රට පනින්න සිද්ධවෙලා තිබෙන්නේ හොරුන්ට නොවෙයි, හොරු අල්ලන නිලධාරීන්ට. මහ බැංකු වංචාව ගැන පරීක්ෂණවලට දැන් මොකද වෙන්නේ? මේ දෙන සංඥාව කුමක්ද? අපිට හානිකර පරීක්ෂණ නවතනු කියා නොවේද? මේ කියන්නේ පරීක්ෂණ නිළධාරීන් ආණ්ඩුවේ රූකඩ වෙයල්ලා, නැතිනම් උඹලගේ ආරක්ෂාව ගැන අපි වගකියන්නේ නෑ කියලා නොවෙයිද? තමන්ට තිබෙන චෝදනාවලට දේශපාලුවෝ නිවැරදි නම් පරීක්ෂණවලට නොබියව මුහුණ දී නීතිය හරියට ක්‍රියාත්මක වීමට ඉඩදිය යුතුයි. එවිට තමන් නිවැරදි නම් ඒක මුළු රටටම පෙන්වන්න පුළුවන්.

තානාපති කාර්යාලයේ නිලධාරියෙක් ගැන පරීක්ෂා කරනවා නම් අදාළ තානාපති දැනුවත් කළ යුතුයි. එය විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් කළ යුතුයි. දැන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ වැඩත් සුදු වෑන් කල්ලිය අතට අරගෙන. මේ ගොල්ලොද රටේ අධිකරණය? මේ පරීක්ෂණ කරන අලුත්ම ක්‍රමවේදයද? ස්විස් තානාපති කාර්යාලයේ නිලධාරීන්ටත් එසේ නම් රටේ සාමාන්‍ය මිනිස්සුන්ට මේ පාලනය කෙසේ වෙයිද? මාධ්‍ය ආයතනවලටත් ළඟදීම 'බීප්, බීප්' ශබ්දය එයි. දැන් මේ පාලකයන්ට ඡන්දය දුන් අයගෙනුයි ඔවුන්ට උදව් කළ මාධ්‍යයෙනුයි අපිට අහන්න තියෙන්නේ 'ඔබට සතුටුයිද දැන්' කියලා. මේ සිදුවෙන දේවල් රාජ්‍යතාන්ත්‍රික මට්ටමෙන් රටේ ආර්ථිකයට, සංචාරක කර්මාන්තයට බලපාන්නේ නැද්ද? මේ සිද්ධිය නිසා ජර්මනියේ හා ස්විස්ටර්ලන්තයේ ශ්‍රී ලංකා තානාපතිට, ස්වීස් රජය හදිසියේ හමුවෙන්න වුණා. නව විදේශ කටයුතු ඇමති දිනේෂ් ගුණවර්ධනගේ පළමු නිල කටයුත්ත වුණෙත් මේ සිද්ධිය ගැන ස්විස් තානාපතිව මුණ ගැසීම. මේක බරපතළ තත්වයක්. ලෝකයට මේකෙන් දෙන සංඥාව කුමක්ද? දිපු බලය අත්තනෝමතිකව හසුවරුවන්න දැන්මම පටන් අරගෙන. පැත්තකින් වෙබ් අඩවිවල මාධ්‍යවේදිනියන් ප්‍රශ්න කරනවා. සී.අයි.ඩී. නිලධාරීන්ටත් මර්දනය. පොලිස් නිලධාරීන්ටත් මර්දනය. අවසානයේ ජනතාවටත් මර්දනය. මේ උදා වෙමින් පවතින්නේ හොඳ තත්වයක්ද?

මේ පාලකයොත් ගමන් කරමින් සිටින්නේ කොහේටද යන්න මේ දින දෙක තුනට සංඥා කරලා ඉවරයි. මොන පාලකයා ආවත් ජනතාව පීඩාවට හා මර්දනයට ලක්කරන ඕනෑම ක්‍රියාමාර්ගයකදී ඊට එරෙහිව සටන් වදින්න, ඒ වගේම ජනතාව දැනුවත් කරන්න ජවිපෙ අපි පසුබට වෙන්නේ නැහැ."


03 පැරණි අර්බුද මත...



මේ සියල්ල දෙස බලන විට සත්‍ය ලෙසම අලුත් නැති 'අලුත් ආණ්ඩුවක්' පැරණි මඟේම...

08 බ්‍රිතාන්‍ය මහ මැතිවරණයට...




බ්‍රිතාන්‍ය යටත්විජිතයක්ව පැවති මොරිෂස් දිවයින්වලට 1965 දී 'නිදහස' ලබාදෙද්දී...

09 ගෝඨාභය ආර්ථික භයට...




ගෝඨාභය ජනාධිපති හමුවේ ඇති ලොකුම අභියෝගය වන්නේ ඡායාරූපය වෙනුවට රාජ්‍ය ලාංඡනය...

වේදිකාව........................ 02
තරුණ.......................... 04
සංවාදය........................ 05
විශේෂ.................... 06-07
විශේෂාංග .................... 10


යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

නොවැම්බර් 11

# නවෝත්පාදන ක්‍රියාවලියට සමාජය එකතු කරගත යුතුයි

(ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට එක්වෙමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා



පනත් කෙටුම්පතට අදාළව කරුණු ඉදිරිපත් කරද්දී කියන්න ඕනෑ, මෙම පනත් කෙටුම්පත ගැන ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාකච්ඡා කරන අවස්ථාවේදී අපේ පාර්ශ්වයෙන් සංශෝධන කිහිපයක් ඉදිරිපත් කළ බව; දැනට ලංකාවේ නවෝත්පාදන පිළිබඳව මූලික වශයෙන් කටයුතු කරන ආයතනයක් තමයි ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම. ලංකාවේ නව නිපැයුම් පිළිබඳව බුද්ධිමය දේපළ පනත යටතේ වාගේම, නව නිපැයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ කටයුතු, ඒ සඳහා වන දත්ත පද්ධතිය database එක පවත්වාගෙන යන්නේ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමයි. නමුත් මේ පනත් කෙටුම්පත යටතේ එන සභාවේ සංයුතියට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ නියෝජනයක් තිබුණේ නැහැ. ඒ නිසා විශේෂයෙන්ම අපි යෝජනා කළා, ශ්‍රී ලංකාව නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ කොමසාරිස්වරයා හෝ සහකාර කොමසාරිස්වරයෙකුගේ මට්ටමේ කෙනෙකු ඒ සභාවට ඇතුළත් කරන්න කියලා. ඒ සංශෝධනය පිළිගෙන තිබෙනවා.

මේ නියෝජ්‍යායතනයේ ප්‍රධානියා වෙන්නේ නවෝත්පාදන නිලධාරියායි. ගැටලුවක් තිබුණා, එම නිලධාරියාගේ සුදුසුකම් සම්බන්ධව. එම නිලධාරියා තෝරා පත්කර ගැනීමේදී නියෝජ්‍යායතනයේ ප්‍රධාන නවෝත්පාදන නිලධාරියා කියන තනතුරේ සුදුසුකම් විධියට තියෙන්නේ කළමනාකරණ පළපුරුද්ද සමග පිළිගත් විශ්වවිද්‍යාලයකින් විද්‍යාව හෝ තාක්ෂණය සහ නවෝත්පාදනයට අදාළ පශ්චාත් උපාධියක් හිමි තැනැත්තෙකු කියන එක. එතැන ප්‍රශ්නය තිබෙන්නේ විද්‍යාව හෝ තාක්ෂණය පිළිබඳව සහ නවෝත්පාදනය පිළිබඳව පශ්චාත් උපාධියක් තියෙන්න ඕනෑ කියන එක. "සහ" කිව්වාම පසුව සඳහන් වන කොටස අනිවාර්යය වෙනවා. ඒ නිසා ඒ ගැටලුව එහෙමම තිබෙනවා; මේ ආයතනය කරගෙන යන්න බැරි වෙනවා. මොකද, ලංකාවේ තවම නවෝත්පාදන පිළිබඳව පශ්චාත් උපාධි දෙන්නේ නැහැ. ඒක නිසාම අපි සංශෝධනයක් යෝජනා කළා. "සහ" කියන එක වෙනුවට නවෝත්පාදනය විෂයයක් වශයෙන් ඇතුළත් වන්නා වූ කළමනාකරණ, තාක්ෂණ එහෙම නැත්නම් විද්‍යා විෂය ධාරාවක පශ්චාත් උපාධියක් තිබෙන පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු මේකට සම්බන්ධ කර ගන්න කියලා. මේ ආයතනයත් විගණකාධිපතිතුමාගේ විමර්ශන යටතේ ඉදිරියේදී පොදු ව්‍යාපාර කාරක සභාව යටතට එනවා. මේ ආයතනය සංස්ථාවක් හැටියටයි ස්ථාපිත වෙන්නේ. විශාල සුදුසුකම් ප්‍රමාණයක් ඔබ්බලා ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන පරිපාලන නිලධාරීන් තනතුරු හදා ගත්තාම ඒවා පනතේ අපූරුවට තිබෙන්න පුළුවන්. හැබැයි, තෝරා ගන්න ගියාම එවැනි සුදුසුකම් තිබෙන අය ප්‍රායෝගික තලයේ නැහැ. එවැනි සුදුසුකම් තිබෙන අය නැතිවුණාම මේ ආයතන කඩා වැටෙනවා; ආයතන පවත්වාගෙන යන්න බැරි වෙනවා. ඒ නිසා විශේෂයෙන්ම ඒ ගැන සැලකිලිමත් වෙලා, අපි එම සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා. මේක අපේ රටට ඉදිරියට යන්න, අනාගත පරම්පරාවට ඉස්සරහට යන්න, අනාගත පරම්පරාව වෙනුවෙන් කළ යුතු දෙයක්.

අපි දන්නවා. අපේ රට කියන්නේ දැවැන්ත ඉඩකඩක් තිබෙන රටක් නොවන බව, කෘෂි කර්මාන්තයෙන් රට දියුණු කරන්න ගියත්, කොපමණ දියුණු කළත් සීමාවක් තිබෙනවා. ඒ හැම එකකම යල් පැනගිය, යැපුම් මානසිකත්වයක් සහිත, අමුද්‍රව්‍ය විතරක් නිෂ්පාදනය කරන, ලෝකයත් එක්ක ඉස්සරහට යන්නේ නැති, ආපස්සට ගාටන තත්වයක් තිබෙන්නේ. මෙහිදී සමාජ නවෝත්පාදනය, ව්‍යාපාරික නවෝත්පාදනය, තාක්ෂණික නවෝත්පාදනය සහ විද්‍යා ක්ෂේත්‍රයේ නවෝත්පාදනය යන මේ හැම එකක් ගැනම අවධාරණය වෙලා තිබීම වැදගත්. මොකද, අපි දන්නවා, අපේ දැනුම තමයි ප්‍රධාන වෙන්නේ කියලා. අපි විශ්වාස කරනවා, දැනුම කේන්ද්‍රීය වුණු ඩිජිටල් තාක්ෂණයත් සමගින් ඉස්සරහට යන, මේ සයිබර් අවකාශයේ ඕනෑම තැනක් අත්පත් කර ගන්න පුළුවන් දැනුම සහිත මිනිසුන් අපේ රටේ සිටින බව, ලෝකයේ බලවත් රටවල්, දුබල රටවල් කියලා මැනෙන්නේ ප්‍රාග්ධනය තිබෙන ප්‍රමාණයෙන් හෝ අවිආයුධ තිබෙන ප්‍රමාණයෙන් හෝ නොවෙයි. එය මනින එක් සාධකයක් තමයි ස්වාභාවික සම්පත්, පිරිසිදු ජලය තිබෙන රටක් ලෝකයේ වටිනාම රටක් බවට පත් වෙනවා. මොකද, ඉන්ධනවලට වඩා ජලයේ වටිනාකම වැඩිවෙලා තිබෙන නිසා.

දෙවන සාධකය තමයි, මොළය තිබෙන මිනිස්සු, මොළය තිබෙන මිනිස්සු සිටින තැන සහ ජලය තිබෙන තැන ලෝකයේ වටිනාම තැනක් බවට පත්වෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, අපේ දරු පරම්පරාවට මේ මෘදුකාංග ලෝකය අත්පත් කර ගන්න පුළුවන් කියලා. අදත් ජාත්‍යන්තරයේ, එක්සත් රාජධානියේ, කොටස් වෙළෙඳපොළේ මෘදුකාංගයේ කොටසක් අපි හදලා තිබෙනවා. නාසා ආයතනයට සම්බන්ධව අපේ මෘදුකාංග ශිල්පීන් බොහෝදෙනෙක් ඉන්නවා. කැලිෆෝනියාවේ ජල සම්පාදනය පිළිබඳව මෘදුකාංගය මොරටුව විශ්වවිද්‍යාලයේ අපේ දරුවෙකු නිර්මාණය කරලා තිබෙනවා. මේ තාක්ෂණය සොයාගෙන පුංචි තිරයකින්, දැන් නම් mobil phone එකකින්, නිර්මාණය කරලා ලෝකය පුරාම

11 වැනි පිටුවට

> සමාජ නවෝත්පාදනය, ව්‍යාපාරික නවෝත්පාදනය, තාක්ෂණික නවෝත්පාදනය සහ විද්‍යා ක්ෂේත්‍රයේ නවෝත්පාදනය යන මේ හැම එකක් ගැනම අවධාරණය වෙලා තිබීම වැදගත්. මොකද, අපි දන්නවා, අපේ දැනුම තමයි ප්‍රධාන වෙන්නේ කියලා. අපි විශ්වාස කරනවා, දැනුම කේන්ද්‍රීය වුණු ඩිජිටල් තාක්ෂණයත් සමගින් ඉස්සරහට යන, මේ සයිබර් අවකාශයේ ඕනෑම තැනක් අත්පත් කර ගන්න පුළුවන් දැනුම සහිත මිනිසුන් අපේ රටේ සිටින බව,

නොවැම්බර් 11

# ක්‍රීඩා පරිපාලනය දූෂිත වෙන්නේ දේශපාලන නායකත්වයේ දූෂිතභාවය නිසයි

(ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට එක්වෙමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක සහෝදරයා



ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සිද්ධ වෙන්නා වූ විශාල වංචා හා දූෂණ පිළිබඳව විගණකාධිපති දෙපාර්තමේන්තුවත්, COPE එකත් විශේෂ විගණනයක් කරනු ලැබුවා. එම නිසා අපට පැහැදිලියි, පසුගිය අවුරුදු 20-25ක පමණ කාලය තුළ විශේෂයෙන්ම ලෝක කුසලාන ජයග්‍රහණයෙන් පසු කාලයේ සිටම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විශාල වශයෙන් දූෂණයට ලක්වෙලා තිබෙන බව; මහාපරිමාණ හොරකමේ මූලස්ථානයක් බවට පත්වෙලා තිබෙන බව. අද ඇත්තටම සිදුවෙන්නේ සූදුවලට සම්බන්ධ පුද්ගලයන්ට ක්‍රිකට් පරිපාලනයට සම්බන්ධ වෙන්න තහනම් කරමින් නිති සැකසීමක්. එම නිතියට අප එකඟයි. නමුත් මා දන්නේ නැහැ. ඒ මන්ත්‍රීතුමා විරුද්ධ පක්ෂය පැත්තේ වෙනුවට අද ආණ්ඩුව පැත්තේ හිටියා නම්, මේ පනත් මේ විධියට ගෙනෙයිද කියලා.

ක්‍රිකට් සම්බන්ධ දූෂණය අද ඊයේ පටන් ගත් එකක් නොවෙයි. මා පෞද්ගලිකව විශ්වාස කරන්නේ නැහැ. ඔට්ටු සූදු ව්‍යාපාරයට සම්බන්ධ පුද්ගලයෙක් ක්‍රිකට් පරිපාලනයට සම්බන්ධ වීම නිසාම තමයි මේ ඔට්ටු සූදුව වෙන්නේ කියලා. පරිපාලනය දූෂිත වෙන්නේ දෙශපාලන නායකත්වය දූෂිත නිසායි. දේශපාලන නායකත්වයේ දූෂිතභාවය නිසා තමයි ඒ පරිපාලනයත් දූෂිත වෙන්නේ. "ඡන්දයෙන් දිනනවා" කියලා කාට හෝ කියන්න පුළුවන්. නමුත් අපි හොඳාකාරවම දන්නවා, ගොඩක් වෙලාවට ඒ අමාත්‍යවරයා, අමාත්‍යාංශ නිලධාරින් සහ ඊට පහළින් තිබෙන සංස්ථාවල සභාපතිවරු අතර තද සම්බන්ධයක් සහිතව තමයි මේ දේවල් සිද්ධ වන්නේ කියලා. එමනිසා මේ පනත් කෙටුම්පත හොඳ දෙයක් වුණාට, මේ හරහා දූෂණය නතර වෙයි කියලා සුරංගනා කථාවක් වාගේ එකක් කියන්න හදනවා නම්, අපි කිසිසේත් එය විශ්වාස කළ යුතු නැහැ.

අපි උදාහරණයක් ගනිමු. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය TV rights සඳහා කැඳවන කොට, ව්‍යාජ account එකකින් වෙනත් රටවලට සම්බන්ධ emailsවලින් තොරතුරු යවලා, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ටෙන්ඩර් කටයුතු පිළිබඳව, අදාළ මිල ගණන් පිළිබඳව ඒ ඒජන්තයන් සම්පූර්ණයෙන්ම දැනුවත් කරනවා. ඇත්තටම, ඒ ඒජන්තයා සහ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තැන් දෙකක ඉඳගෙන එකට වැඩකරනවා. ඇත්තටම මෙහිදී සිදුවන්නේ මොකක්ද? මේ සම්බන්ධව වංචා දූෂණ හෙළි වුණාට පසුව ඒ පිළිබඳව හදිසි audit එකක් කරනවා. මුදල් බහමාස්වල තිබෙන accountsවලට යනවා. නමුත්, audit එක සිදුවන කොට ඒ සල්ලි පෙන්වන්න ඕනෑ. ඒ නිසා, සල්ලි ඉක්මනට ගෙනෙන්න කියා යැවූ emails තිබෙනවා. ඒවා පිළිබඳ තොරතුරු audit එකට ඇවිත් තිබෙනවා. මේවා ඉතාම කුප්‍රකට ක්‍රියා ලෙස අපි දකිනවා. ක්‍රිකට් ක්‍රීඩාව "මහත්වරුන්ගේ ක්‍රීඩාව" කියලා කිව්වාට, පාලකයෝ එය තුට්ටු දෙකේ වැඩක් බවට පත්කරගෙන තිබෙනවා. හැම එක්කෙනාම ඒකට කෙළ හළන ප්‍රමාණයෙනුත් එහි තරම අපට පෙනෙනවා. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලවරණය දෙවැනි වන්නේ ජනාධිපතිවරණයට විතරයි. මෙහිදී අප දකින දේ තමයි, ඔට්ටු සූදුකරුවන් අයින් කිරීම හොඳ දෙයක් වුණාට එහි තිබෙන දූෂණය එතැනින් නතර වන්නේ නැහැ කියන එක. මා ඉතා වගකීමෙන් කියනවා. මේ සම්බන්ධයෙන් COPE එකට සමහර තොරතුරු ලබා දෙන්නේ, ඒ සමහර දූෂණවලට ඊට කලින් සම්බන්ධ වෙලා සිටි අය කියලා. මේ වෙලාවේ ඒකත් කියන්න ඕනෑ.

ඒ වාගේම, දේශපාලනඥයන්, දේශපාලන තනතුරු දරන පුද්ගලයන්, ක්‍රීඩා සංගම්වල සභාපති ධුර දරන එකත්, අන්තර් පාලන කමිටුවලට පත්වන එකත් ඒ හා සමානම වරදක් ලෙස අපි දකිනවා. මොකද, සමහර දේශපාලනඥයෝ සියලු සංස්ථාවල තනතුරුවලට තමන්ගේ ඥාතීන් පත් කරනවා. අපි ඒකත් මේ වෙලාවේ කියන්න ඕනෑ. ඒ නිසාම මේ කතා කරන සමහර අය තමන් යටතේ තිබෙන කිසිම ආයතනයකින් ලාභ ඇති කරලා නැහැ. අපි ඒකයි කියන්නේ. ක්‍රිකට් ක්‍රීඩාව රැක ගැනීම කියන කාරණයට මුවාවුණාට දේශපාලන ප්‍රශ්නයකුත් එක්ක මෙය බැඳිලා තිබෙනවා කියලායි මා හිතන්නේ. අපි මේ පනත් කෙටුම්පතට සහමුලින් එකඟයි. නමුත්, මෙමගින් ප්‍රශ්න සියල්ල සම්පූර්ණයෙන් විසඳෙනවාය කියන මිථ්‍යාවට අප යා යුතු නැහැ.

මා විශේෂයෙන්ම ක්‍රිකට් ක්‍රීඩකයන් ගැන කියන්න කැමැතියි. ක්‍රිකට් ක්‍රීඩකයන් සියලුදෙනා සම්බන්ධව නොවෙයි මා මේ කාරණය කියන්නේ. මුළු රටම අපි ආදරය කරන, ගරු කරන ක්‍රිකට් ක්‍රීඩකයො ඉන්නවා. හැබැයි, ඒ අය අතර විවිධාකර ක්‍රිකට් ක්‍රීඩකයන් ඉන්නවා. මම දන්නේ නැහැ. ඒ අය ඔට්ටු අල්ලලාද නැද්ද, match - fixing කරලාද නැද්ද කියලා. නමුත් රට වෙනුවෙන් සෙල්ලම් කරන ක්‍රිකට් ක්‍රීඩකයන් ප්‍රමාණයත් එන්න එන්නම අඩු වෙනවා. ඒකත් ඇත්ත. ඒ කියන්නේ matches දිනනකොට අපි ඒ අයට ආදරෙයි තමයි. නමුත් අපට පෙනෙනවා, එතැන පිරිහීමක් තිබෙන බව. ශ්‍රී ලංකා ක්‍රිකට් ආතයනය තුළ දූෂිතයන් ඉන්නකොට, ඒ දූෂිතයන් ක්‍රිඩකයන්ගේ විනය හදන්න යන්නේ නැහැ; කෙළින් තීන්දු ගන්නත් බැහැ. මොකද, ක්‍රීඩකයෝත් දන්නවා. උඩ ඉන්නේ දූෂිතයෝ කියලා. අවසානයේ ඇත්තටම ලංකාවට තමයි "පවු" කියලා කියන්න වෙන්නේ. ප්‍රේක්ෂකයන්ට තමයි "පවු" කියලා කියන්න වෙන්නේ. අපේ අය ඕස්ට්‍රේලියාවට ගියාම ලාංකික ප්‍රේෂකයෝ දහස් ගණනක් ඇවිල්ලා cheer කරන හැටි බලන්න. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය

11 වැනි පිටුවට

> ක්‍රිකට් ක්‍රීඩාව "මහත්වරුන්ගේ ක්‍රීඩාව" කියලා කිව්වාට, පාලකයෝ එය තුට්ටු දෙකේ වැඩක් බවට පත්කරගෙන තිබෙනවා. හැම එක්කෙනාම ඒකට කෙළ හළන ප්‍රමාණයෙනුත් එහි තරම අපට පෙනෙනවා. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලවරණය දෙවැනි වන්නේ ජනාධිපතිවරණයට විතරයි. මෙහිදී අප දකින දේ තමයි, ඔට්ටු සූදුකරුවන් අයින් කිරීම හොඳ දෙයක් වුණාට එහි තිබෙන දූෂණය එතැනින් නතර වන්නේ නැහැ කියන එක.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

## දඩයම ඇරඹී තිබේ!...

වර්තමාන පාලනයේ 'නගර අලංකරණය', 'සරල ජනාධිපති' වැනි සංදර්ශනවාදී ආකර්ෂණීය සංකල්පවලට යටින් විරුද්ධවාදීන් දෙසට වූ දඩයම ආරම්භ වී තිබේ. එය පටන්ගෙන ඇත්තේ පැරණි රාජපක්ෂ පාලනයේ වංචා දූෂණ හා අපරාධ පිළිබඳ පරීක්ෂණ පැවැත්වූ රහස් පොලිසිය ඇතුළු නෛතික ආයතනවලට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිවය. දැනටමත් රහස් පොලිසියෙ හිටපු ප්‍රධානියා වූ ශානි අබේසේකර ඇතුළු නිලධාරීන් විශාල පිරිසකට රටින් පිටවීම තහනම් කරනු ලැබ තිබේ. ඔවුන් පිළිබඳ 'පරීක්ෂණ'ද අරඹා තිබේ. දැනටමත් රටින් පලාගොස් සිටින පො.ප. නිශාන්ත සිල්වා 'කොටි ඔත්තුකරුවෙක්' ලෙසට නම් කරමින් තිබේ. එම නම් කිරීම කර තිබෙන්නේ කිසියම් විධිමත් පරීක්ෂණයකින් පසු අදාළ බලයලත් ආයතනයකින් නොව පසුගිය කාලයේ පරීක්ෂණවලට මුහුණ දුන් දූෂිත පුද්ගලයන් විසිනි. (නිශාන්ත සිල්වා හෝ වෙනත් නිලධරයෙක් ගැන චරිත සහතික දීමට අපට අවශ්‍ය නැති බවද මෙහි සඳහන් කළ යුතුය.) එහෙත් සිදුවීම් දෙස බලනවිට 'දඩයම' විසින් දඩයක්කරුවා දඩයම් කිරීම අරඹා ඇති බව පෙනේ.

පැරණි රාජපක්ෂ පාලනය තුළ මූල්‍ය වංචා ඇතුළු අපරාධ රැසක් සිදුවූ අතර ඒ වෙනුවෙන් කිසිවෙක් මේ වනතුරු දඬුවම් ලැබුවේ නැත. පැවති එ.ජා.ප. ආණ්ඩුවද මූල්‍ය වංචා රැසකට සම්බන්ධ අතර ඒ වෙනුවෙන්ද නීතිය ක්‍රියාත්මක වූයේ නැත. ඒ, නීතිය පාලකයන්ට එරෙහිව ක්‍රියාත්මක නොවන නිසාය.

කෙසේ වුවත් පැරණි පාලනයට සම්බන්ධව සිට මූල්‍ය වංචා හා අපරාධ පිළිබඳ නඩු පැවරී ඇති මහත්වරු තමන් නිර්දෝෂී නම් කළ යුත්තේ, අධිකරණමය ක්‍රියාමාර්ගවලට මුහුණදී තම නිර්දෝෂී බව ඔප්පුකිරීමය. එය කළ යුත්තේ නීතිපති දෙපාර්තමේන්තුවට, අධිකරණයට නිදහසේ ක්‍රියාත්මක වීමට ඉඩ දෙමින් හා පරීක්ෂණ සිදු කළ නිලධාරීන්ට තම කාර්යය අවසන් කිරීමට ඉඩ දෙමිනි. එහෙත් සිදුවෙමින් පවතින දෙය ඉතා පැහැදිලිය. පළමුව අපරාධ පරීක්ෂණ සිදුකළ නිලධාරීන් දඩයම් කිරීම අරඹා පසුව සාක්ෂිකරුවන් බියවැද්දීම හා සාක්ෂි වෙනස් කිරීම ඔස්සේ නීතිපති විසින් චෝදනා සංශෝධනය කිරීම හෝ ඉල්ලා අස්කර ගැනීම දක්වා මෙම ක්‍රියාවලිය සිදුවනු ඇත. වැද්දාට 'ගොරක දඩමස් කිරීමටත් දඩමස් ගොරක කිරීමටත්' හැකි යයි අපේ ජනවහරේ කියමනක් තිබේ. මේ ඇරඹී ඇත්තේ 'ගොරක' 'දඩමස්' කරන හා 'දඩමස්' 'ගොරක' කරන කාලයක් බව සිදුවීම් දෙස බලන විට ඉතා පැහැදිලිව පෙනේ.

පැරැණි පැරණි රාජපක්ෂ පාලන සමය තුළ ලංකාවේ සිදුවූ සුප්‍රසිද්ධ මිනිස් ඝාතනවලට, මූල්‍ය වංචාවලට අදාළ චූදිතයන් සිටිය යුතුය. එ.ජා.ප. පාලනය තුළ සිදු වූ මහපරිමාණ මූල්‍ය වංචාවලටද අයිතිකරුවන් සිටිය යුතුය. එහෙත් වසර ගණනාවකට පසුවත් කිසියම් මිනිස් ඝාතනයකට අදාළ මිනීමරුවා සොයාගත නොහැකි නම්, මූල්‍ය වංචාවකට අදාළ වංචනිකයා සොයාගත නොහැකි නම් ඉන් කියවෙන්නේ එකී අපරාධකරුවන් නීතියට ඉහළින් සිටින බව හා නීතිය හසුරුවන බවය.

කිසියම් ආණ්ඩුවක ප්‍රබලයන් විසින් සිදුකළ මූල්‍ය හා වෙනත් අපරාධ පිළිබඳ පරීක්ෂණ කරන නිලධාරීන් ආණ්ඩුව මාරුවූ විගස දඩයම් කිරීම අරඹන්නේ නම් මින්පසු කිසිම නිලධාරියෙක් ආණ්ඩුවලට සම්බන්ධ ප්‍රබලයන්ගේ අපරාධ ගැන පරීක්ෂණ නොකරනවා ඇත. රටේ ජනතාවද තම දේශපාලන පක්ෂපාතිත්වය වෙනුවෙන් එකී දඩයමට සහාය දක්වන විට තත්වය තවත් බරපතළ වනු ඇත. ඉන් වඩාත්ම අනාරක්ෂිත වන්නේ පොදු ජනතාවමය. මන්ද එවැනි තත්වයක් තුළ පාලකයන් අපරාධ කිරීමට බිය නොවන නිසාත් දෙවරක් නොසිතා අපරාධ කරන නිසාත්ය. එය බරපතළ තත්වයකි. තම දේශපාලන මතය කුමක් වුවත් දූෂිතයන්ට අපරාධකරුවන්ට නිදැල්ලේ සිටීමට ඉඩ දෙමින් ඔවුන්ගේ අපරාධ 'අපේ හොරා අපට හොඳා' යන න්‍යාය තුළ නොසලකා හරිමින් කටයුතු කිරීම සභ්‍ය සමාජයකට ගැලපෙන්නේ නැත. ඉක්මනින් හෝ පසුව එහි ප්‍රතිවිපාකවලට මුහුණ දීමට මෙරට පොදු ජනතාවට සිදුවන බව අවධාරණය කළ යුතුය.

අවසාන වශයෙන්, 'ගොරක දඩමස්' කරමින් 'දඩමස් ගොරක' කරන මෙම ක්‍රියාවලිය වාසි සලසන්නේ රාජ්‍ය පාලනය තුළ ඉන්නා අපරාධකරුවන්ට පමණක් බවත් රටට හෝ පොදු ජනතාවට ඉන් කිසිදු යහපතක් සිදුනොවන බවත්, මෙහි සැබෑ පලවිපාක ජනතාව තේරුම් ගනු ඇත්තේ අපරාධකරුවා තමන්ගේ නිවසේ දොරට තට්ටු කරන දිනයට බවත් එවිට බොහෝ ප්‍රමාද වී තිබිය හැකි බවත් අවධාරණය කළ යුතුව තිබේ.

# පැරණි අර්බුද මත ගමන් අරඹන 'අලුත්' ආණ්ඩුව



2019 ජනාධිපතිවරණය අවසන් වූයේ ගෝඨාභය රාජපක්ෂ මහතා ජය ගැනීමෙනි. දැන් ඔවුන් විසින් තාවකාලික ආණ්ඩුවක්ද පිහිටුවා බලය තමන් අතට ගෙන තිබේ. ව්‍යවස්ථාවේ ඇති ප්‍රතිපාදනවලට අනුව බොහෝවිට මාර්තු මුල පාර්ලිමේන්තුව විසුරුවා අනතුරුව මහ මැතිවරණයක් පවත්වනු ඇත. ජනාධිපතිවරණයේ ප්‍රතිඵල අනුව එම මහ මැතිවරණයෙන්ද පොදු ජන පෙරමුණ ජයගනු ඇත. ඔවුන් මහ මැතිවරණයේදී ශක්තිමත් ආණ්ඩුවක් (තුනෙන් දෙකේ බලයක්) ඉල්ලා සිටිනු ඇත. මේ නිසාම ඉදිරි මාස 3 - 4ක කාලය ඔවුන් ගත කරනු ඇත්තේ හැකිතරම් පරිස්සමෙන් ඔවුන් වෙත ජනතා විරෝධය එල්ල නොවන ලෙසය. අලුත් ආණ්ඩුවක් පත්වූ විට 'අලුත ගෙනා මනමාලී' මෙන් ජනතාවටද හැම දෙයක්ම 'හොඳ දේවල්' සේ පෙනෙනු ඇත. එහෙත් අලුත් ආණ්ඩුව අභියස ඇති පැරණි අභියෝග කන්දරාවත්, ආණ්ඩුවේ පෙනුම අලුත් වුවත් සංයුතිය පැරණි ආණ්ඩුවම වන නිසාත් ඉතා ඉක්මනින් යථාර්ථය වටහා ගැනීමට ජනතාවට සිදුවෙනු ඇත.

මෙම ජනාධිපතිවරණයේදී එ.ජා.ප.ය හා පොදු ජන පෙරමුණ යන දෙපාර්ශ්වයම ඡන්දය සඳහා යොදාගත් ප්‍රධාන උපාය වූයේ ජනතාව බියවද්දා ඡන්ද ගැනීමය. ප්‍රතිපත්ති, පොරොන්දු තිබුණේ ඊට බොහෝ පහළිනි. සජිත් ප්‍රේමදාසලා 'ගෝඨාභය බිය' යොදාගත් අතර, ගෝඨාභය රාජපක්ෂලා රටට අනතුරක් ඇති බව පෙන්වා 'රට රැකීම' තම සටන් පාඨය කරගත්හ. උතුරු හා නැගෙනහිර 90% - 80% තරම් ඡන්ද සංඛ්‍යාවක් ලබාගැනීමට සජිත්ට හැකි වූයේත් සිංහල බහුතරයක් සහිත ප්‍රදේශවල 60%-70% තරම් ඡන්ද ප්‍රමාණයක් ලබාග ැනීමට ගෝඨාභයට හැකි වූයේත් මේ තත්වය තුළය. ජාතික ජන බලවේගයට ලැබීමට තිබූ ඡන්ද අඩුවීමට ප්‍රධාන හේතුව වූයේත් මෙයමය.

කෙසේ වෙතත් දිගුකාලීනව කල්පනා කරන විට නව පාලනය මුහුණ දෙන ගැටලු හා අභියෝග රැසක් තිබෙන බව පෙනේ. ඒවා විසඳීමේ හැකියාවද මෙම පාලනයට නැත. මෙම ඡන්ද ප්‍රතිඵලය විසින් භෞමිකව නැතත් දේශපාලනික උතුරු-නැගෙනහිර හා සෙසු ප්‍රදේශ පැහැදිලි බෙදුම් රේඛාවකින් වෙන් කරනු ලැබ තිබේ. ඒ, ජාතිකත්ව බෙදුම් රේඛාවය. එය වෙනස් කර ජාතික සමගිය හැදීමට වත්මන් පාලනය සමත්වන්නේ නැත. ඒ වෙනුවට ව්‍යාජ සිංහල බෞද්ධ රාජ්‍ය සංකල්පය තුළ කටයුතු කරන ඔවුන් මෙම බෙදුම් රේඛාව තව තවත් ගැඹුරු කරනු ඇත. ඒ තුළ මතුවන ජාතිවාදී දේශපාලනය පැරදවීමට සජිත් සමත්වන්නේද නැත. ඒ අනුව ජාතික සමගියේ ධජය නිතැතින්ම හිමි වන්නේ ජාතික ජන බලවේගය වෙතය.

අනෙක් අතට රට මුහුණ පා තිබෙන දැවැන්ත ආර්ථික අර්බුදයට හා ණය අර්බුදයට පැහැදිලි විසඳුමක් වත්මන් පාලනයට නැත. 2020 වසරේ ගෙවිය යුතු රුපියල් ට්‍රිලියන එකක් වූ ණය වාරිකය ගෙවීමට ඔවුනට සිදුවන්නේ තවත් ණයක් ගැනීමෙන් පමණි. එහි ප්‍රතිඵලය වන්නේ ණය උගුල තව තවත් විශාල වීමය. එසේම ඉදිරි මාස කිහිපය තුළ ආණ්ඩුව ජනතාවට පෙනෙන 'යමක්' කළ යුතුව ඇත. ඉදිකිරීම්, නගර අලංකාර කිරීම් වැනි එකී 'අයිසිං' වැඩද, මුදල් වියදම් වන වැඩ මිස ආදායම් ලැබෙන වැඩ නොවේ. එබැවින් ආර්ථික අර්බුදයේ බර ජනතාව වෙත පටවන්නේ නැතිව ගමන් කිරීමට ආණ්ඩුවට හැකිවන්නේ නැත. දැනටමත් පාන්පිටි, සහල්වල සිට සිමෙන්ති කොට්ටය දක්වා මිල වැඩිවීම ආරම්භ වී තිබීම අනාගත ජීවන බර පිළිබඳ පෙරමඟ සලකුණු බව පැහැදිලිය.

ජනාධිපතිවරයා ලෙස ගෝඨාභය රාජපක්ෂ ජයග්‍රහණය කිරීමත් සමග දැනටමත් මතුපිටට පවා පෙනෙන පවුලේ අර්බුදයක්ද ඇතිවී තිබෙන බව පෙනේ. ඒ, ගෝඨාභය රාජපක්ෂගේ ජනාධිපති බලය හා මහින්ද රාජපක්ෂගේ දේශපාලන පෞරුෂයේ බලය අතරය. මහින්ද රාජපක්ෂ යනු හිටපු ජනාධිපතිවරයාය. පොදු ජන පෙරමුණේ නායකයාය. තම පාක්ෂිකයන්ගේ හා හිතවතුන්ගේ ආකර්ෂණය ඇත්තේ ඔහුටය. එබැවින් ඔහු ජනාධිපති මල්ලී ඉදිරියේ දෙවැනි වීමට කැමති නැත. බලය හමුවේ දෙවැනියෙක් වීමට මහින්ද රාජපක්ෂගේ චින්තනය ඉඩ නොදෙයි. ඒ අනුව 'ජනාධිපති' හා 'අගමැති' අතර ප්‍රතිවිරෝධද ඔවුන්ගේ ආණ්ඩුවේ ගමන්මග තීරණය කිරීමට සැලකිය යුතු දායකත්වයක් දක්වනු ඇත. තාවකාලික අගමැතිකම බාර ගන්නා මොහොතේ මහින්ද රාජපක්ෂගේ මුහුණේ ඉරියව් කියාපෑවේ එම ප්‍රතිවිරෝධය වේ.

ඊට අමතරව සමාජය විසින් 'හොඳ තීරණ' ලෙස දකින සමහර තීරණ පිටුපසද මෙම බල ප්‍රතිවිරෝධය තිබෙන බව පෙනේ. රජයේ ආයතනවල ජනාධිපති හා මැතිඇමති රුව ප්‍රදර්ශනය නොකිරීමට ගත් තීරණයද මහින්ද රාජපක්ෂ දෙවැනියෙක් වීමට ඇති අකමැත්ත නිසා ගැනුණු තීරණයක් බව බොහෝ දෙනාගේ මතය වී තිබේ. එසේම ජනාධිපතිවරයාගේ කටවුට් හා පෝස්ටර් ඉවත්කිරීම තුළද මහින්ද ඉක්මවා ගෝඨා ජනප්‍රිය වීමට ඇති අකමැත්ත සේම මහින්දට යටින් සිටීමට ගෝඨාගේ ඇති අකමැත්තද තිබෙන බව පෙනේ.

දැනට ගෝඨාභය රාජපක්ෂ පාලනය තුළ ගත් සමහර 'යහපාලන' ක්‍රියාමාර්ග මහින්දට එරෙහි ලෙස ගැනෙන ක්‍රියාමාර්ග වේ. රාජ්‍ය ආයතන තුළ ඡායාරූප ප්‍රදර්ශනය නොකිරීම, පාරේ කටවුට් ප්‍රදර්ශනය නොකිරීම, ආරක්ෂක රථ ප්‍රමාණය අඩුකිරීම, ජනාධිපති මැදුර හෝ අරලියගහ මැදුර භාවිත නොකිරීම යන ක්‍රියාමාර්ගවලින් ප්‍රශ්න කරනු ලබන්නේ මහින්දගේ අතීතය වේ. මන්ද, දැන් ගෝඨා ප්‍රතික්ෂේප කරන හා ජනතාව අගය කරන මෙම දේවල් මහින්දගේ සමයේ මහා පරිමාණයෙන් සිදුවූ දේවල් නිසාය.

ගෝඨා, මහින්දවාදයෙන් මිදී ස්වාධීන මඟක යාමටද කැමති බව පෙනෙන්නට තිබේ. සියලු රාජපක්ෂවරු ඊනියා කුරහන් සාටකය පළඳිද්දී, ගෝඨා එය පැළඳීම අත්හැර තමන් තවත් රාජපක්ෂ කෙනෙක් නොවන බව පෙන්වා තිබේ. මේවා සරල කරුණු සේ පෙනුණද පවුලේ බල ප්‍රතිවිරෝධයන් ඒ තුළින් පෙනෙන්නට තිබේ.

අනෙක් අතට බලය කප්පාදු කළ ජනාධිපති ධුරයක් හා බලතල වැඩි අගමැති ධුරයක් ලෙස බලකේන්ද්‍ර දෙකක් දිගට පැවතිය නොහැකි අතර, එක් බලකේන්ද්‍රයක් යට කොට අනෙක ඉහළට ආ යුතුය. එය කෙසේ සිදුවනු ඇත්දැයි දැන් අනාවැකි කීමට නොහැකි වුවත් එම ප්‍රතිවිරෝධ පදනම් කරගත් ව්‍යවස්ථා වෙනස් කිරීමේ ක්‍රියාවලියක් හා ඒ තුළ ගැටුම් මතුවීමක් අපේක්ෂා කළ හැක. දැනට ජනවරම ඇත්තේ ගෝඨාභය සතුව වුවත් තව මාස කීපයකට පසුව පැවැත්වෙන මහ මැතිවරණයෙන් පසු මහින්ද රාජපක්ෂ අගමැති වන්නේද ජනවරමක් සහිතවය. එම තත්වය තුළ මහින්ද තම බලය වැඩිකර ගැනීමට උත්සාහ කිරීම බලාපොරොත්තු විය යුත්තක්ම වේ.

මේ සියල්ල අතර ආණ්ඩුව වටා සිටින බලවේග නැවුම් එකක් නොවේ. එය පැරණි අන්ත දූෂිත බලවේගයමය. හොරු රැලක් රට පාලනය කරන

11 වැනි පිටුවට

> මේ සියල්ල දෙස බලන විට සත්‍ය ලෙසම අලුත් නැති 'අලුත් ආණ්ඩුවත්' පැරණි මඟේම ගමන් කරනවා ඇත. එහිදී ජනතාව පීඩාවට පත්වීම නොවැළැක්විය හැකි වනු ඇත. එවිට ජනතාවට තමන් වෙනුවෙන් සටන් වදින දේශපාලන බලවේගයක් හා ප්‍රබල විපක්ෂයක් අවශ්‍ය වේ. ඉදිරි දේශපාලනයේ ප්‍රබල විපක්ෂයේ කාර්යය ඉටුකළ හැකි වන්නේ මුදලට විකිණීමට බලාපොරොත්තුව සිටින එ.ජා.ප.යට නොව ජාතික ජන බලවේගයටය.

තුරුණු



# ඇමරිකානු රාජ්‍ය ලේකම්ගේ ප්‍රකාශය දැඩි පිළිකුලෙන් යුතුව හෙළා දකිමු!...




ප්‍රසුගියදා ඇමරිකානු රාජ්‍ය ලේකම් මයික් පොම්පියෝ විසින් ප්‍රකාශයක් සිදු කරමින් කියා සිටියේ ට්‍රම්ප් පරිපාලනය විසින් බටහිර ඉවුරේ ඊශ්‍රායල් ජනාවාස පිහිටුවීම තවදුරටත් ජාත්‍යන්තර නීතියට පටහැණි යැයි නොසිතන බවයි. මේ ප්‍රකාශය හේතුවෙන් වර්තමාන එක්සත් ජනපද පාලනය පලස්තීන විරෝධී න්‍යාය පත්‍රයක් අනුගමනය කරමින් ඊශ්‍රායල යටත්විජිත න්‍යාය පත්‍රය බලගැන්වීමට හා නීත්‍යානුකූල කිරීමට නිර්ලජ්ජිත උත්සාහයක නිරතව තිබේ. එමෙන්ම එය සියලු පිළිගත් ජාත්‍යන්තර නීති සම්මුති හා ලෝක ජනමතය උල්ලංඝනය කර තිබේ. එබැවින් පලස්තීනයේ නිදහස වෙනුවෙන් සෑම විටම නැගී සිටින තරුණ සංවිධානයක් ලෙස සමාජවාදී තරුණ සංගමය මෙම ප්‍රකාශය දැඩි පිළිකුලෙන් යුතුව හෙළා දකින්නෙමු.

එමෙන්ම වර්තමානය වන විට ඉතිහාසයේ අන් කවර කවරදාකටත් වඩා පලස්තීනය තුළ සිදුකරන ම්ලේච්ඡ ප්‍රහාරයන් හා ඝාතනයන්ට මුහුණදීම පලස්තීනුවන්ගේ දෛනික ජීවිතයේ කොටසක් තරමට පැමිණ තිබේ. ඔවුන්ගේ දෛනික ජීවිතයේ සෑම අංශයක්ම අඛණ්ඩ බලපෑමට හා කඩා වැටීමට ලක්ව ඇත. විශේෂයෙන් දරුවන්ගේ තත්වයද හද කම්පා කරවන බේදවාචකයක් වී තිබේ. ලෝක ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සම්මත වී වසර 30 සැපිරෙන මේ මොහොත වන විට වනවිට පලස්තීන දරුවන්ගේ අයිතිවාසිකම් බරපතළ ලෙස උල්ලංඝනය වී තිබේ. මිලියන 1.9 ක ජනගහනයෙන් අඩක් ළමුන් සිටින ගාසා තීරයේ 2018 සැප්තැම්බර් මාසයේ සිට වසරක් තුළ පහරදීම්වලින් ළමුන් 29ක් ඝාතනය වී 4387ක් තුවාල ලබා තිබේ. බටහිර ඉවුරේ ළමුන් 6 දෙනකු ඝාතනය වී 1238 දෙනකු තුවාල ලබා ඇති බවට වාර්තා වේ.

එමෙන්ම ගාසා තීරය තුළ විරෝධතාවයන්ට එරෙහිව සිදු කරන ලද ප්‍රහාරයන් හමුවේ පලස්තීනුවන් 138ක් ඝාතනය වී ඇති අතර 15,901ක් තුවාලකරුවෝ බවට පත්ව සිටිති. එමෙන්ම වසර 13ක අඛණ්ඩ සම්බාධක හමුවේ ගාසා තීරයේ පලස්තීනුවන් හට අත්‍යවශ්‍ය ඖෂධ හා සෞඛ්‍ය සේවා ලබා ගැනීමට පවා නොහැකිව අසරණ වී ඇත. ඊට අමතරව බලහත්කාරයෙන් ඉඩම් අත්පත් කර ගැනීම, පලස්තීනුවන්ගේ නිවාස කඩා ඉවත් කිරීම, ගමනාගමනය සීමා කිරීම, අත්තනෝමතික පරිපාලන රැඳවුම් භාවිතය හා හිංසනය සහ වගවීමක් නොමැතිවීම නිසා පලස්තීනුවන් උපන් බිමේ සරණාගතයන් බවට පත්ව තිබේ.

සියල්ල එසේ සිදුවද්දී පලස්තීනුවන් විසින් දැවැන්ත දුෂ්කරතා මධ්‍යයේ වුවද විදදරා ගනිමින්, අධිෂ්ඨානශීලිව ඔවුන්ගේ ජාතික අනන්‍යතාවය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් සිදුකරන කැපවීම ප්‍රශස්ත මට්ටමක පවතී. නිදහස් පලස්තීනයක් උදෙසා නීත්‍යානුකූල අයිතිවාසිකම් සහ අභිලාෂයන් මත ඔවුන් සිදුකරන සාධාරණ විමුක්ති අරගලය අනාගතයේදී නිසැකවම ජය ගනු ඇත.

පලස්තීනයට නිදහස දිනාගත හැකි වන්නේ අධිරාජ්‍යවාදීන්ටත්, පැසිස්ට්වාදීන්ටත්, ඊට උඩගෙඩි දෙන ධනේශ්වර පාලනයන්ටත් එරෙහිව සිදු කරනු ලබන අනවරත අරගලයකින්ම පමණි. එසේම පලස්තීන ජනතාව සමග ලොව පුරා සිටින සමාජවාදී, ප්‍රගතිශීලී, අධිරාජ්‍ය විරෝධී සියලු ජන කොටස් ඒකරාශී කරගත් දැවැන්ත ජනතා ව්‍යාපාරකින් පමණක්ම එය ඉටු කළ හැකි බව සමාජවාදී තරුණ සංගමය, සමාජවාදී ශිෂ්‍ය සංගමය සහ අප මව් පක්ෂය වන ජනතා විමුක්ති පෙරමුණත් උපරිම සහාය ලබා දීමට අපි කැප වන්නෙමු. එමෙන්ම මෙම අන්තර්ජාතික පලස්තීන සහයෝගිතා දිනයේ දී ජාත්‍යන්තර ප්‍රජාවට ඊට එක්වන ලෙසත් අපි ආරාධනා කරන්නෙමු.

***පලස්තීනයට එරෙහි ආක්‍රමණ නවතනු!***

***පලස්තීනයට ජීවත් වීමට ඉඩ දෙනු!***

***ඇමරිකානු එක්සත් ජනපද, ඊශ්‍රායල් අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණ පරදවමු!***

**සමාජවාදී තරුණ සංගමය**

2019.11.29




## YES WE CAN

## ස්මාර්ට් හීනයෙන් දේශප්‍රේමී හීනයට...

ෆ්‍රී wifi, ටැබ්, ස්මාර්ට් බැලුන්, සිහින බලාපොරොත්තු කන්දක් අපේ රටේ තරුණ පරම්පරාව මත පැටවූ පසුගිය ශ්‍රීල.නි.ප - එ.ජා.ප හවුල් ආණ්ඩුව ඒ බලාපොරොත්තු මහ දවාලේම සුන්කර දැමුවේය.

ෆ්‍රී wifi දෙනවා වෙනුවට කළේ දුරකථන ගාස්තු මත 50% කට ආසන්න බදු පැනවීමය. ටැබ් දෙනවා වෙනුවට කළේ නව බදු පනත් මගින් භාණ්ඩ මිල ඉහළ නැංවීමය, තරුණ තරුණියන්ගේ අධ්‍යාපන අවස්ථා ඇහිරීමය. ස්මාර්ට් බැලුන් කෙසේ වෙතත් මත්කුඩු ඇතුළු විෂ මත් ද්‍රව්‍ය වැඩි වැඩියෙන් තරුණ පරම්පරාව අතර ව්‍යාප්ත විය. තරුණ අසහනය දිනෙන් දින වර්ධනය විය.

මෙලෙස පැවති ශ්‍රීල.නි.ප. - එ.ජා.ප. හවුල් ආණ්ඩුව රටේ ජනතාව හෝ තරුණ පරම්පරාව බලාපොරොත්තු වූ ප්‍රධාන කාරණා කිසිවක් ඉටු කිරීමට සමත් වූයේ නැත. එවැනි වටපිටාවක දේශපාලන වාසි වෙනුවෙන් පසුගිය ආණ්ඩුවත්, රාජපක්ෂ කඳවුරත් හරි හරියට ජාතිවාදය වැපිරුවේය. එය ප්‍රබල සහ වඩාත් තීව්‍ර වූයේ අප්‍රේල් 21 ත්‍රස්ත ප්‍රහාරයෙන් පසුවය.

ඒ නිසා රට ජාතිය බේරාගැනීම මොහොතට ගැලපෙන ආකර්ෂණීයම මාතෘකාවක් බවට පත්විය. ස්මාර්ට් හීනයෙන් දේශප්‍රේමී හීනයට අපේ රටේ තරුණ පරම්පරාව මාරු වූයේ එලෙසය. ඒ බව මේ ජනාධිපතිවරණ ප්‍රතිඵලයෙන් විද්‍යමාන වන්නේය. ඇත්ත අර්බුදය දකිනවා වෙනුවට දැක ඇත්තේ අර්බුදය පෝෂණය කිරීමට දායක වූ එක් කාරණයක් වන ජාතික ප්‍රශ්නයයි. එයටද අවතීර්ණ වී ඇත්තේ ජාතිවාදී ලෙසය. ඊනියා දේශප්‍රේමීන්ගේ බල වුවමනාවන් වෙනුවෙන් නැවතත් රටේ ජනතාවත් තරුණ පරම්පරාවත් උකසට තබා ඇත. මෙය රටත් තරුණ පරම්පරාවත් ලත් විශාල පරාජයකි.

දැන් ඒකායන පරමාර්ථය වී ඇත්තේ රට ජාතිය බේරා ගැනීමය. බේරා ගැනීමට රටක් ඉතිරි වී තිබේද? නැත. 71 වසරක් තුළ වර්තමාන පාලකයන් හා පැරණි පාලකයන් විසින් අපේ රට හප කර සාරය උරා බී අවසන්ය.

එසේම බේරා ගැනීමට ජාතියක්ද නොමැත. මක්නිසාදයත් සියලු ජාතීන් අතර අවිශ්වාසය වපුරා අවසන් බැවිනි. කුරිරු තිස් වසරක යුද්ධයකට ඇද දමා අපේ රටේ ජනතාව විරසක කර දමා ඇත. අමානුෂික ලෙස මරාගෙන මැරෙන ප්‍රහාර එල්ල කරමින් සියලු මුස්ලිම්වරුද "ත්‍රස්තවාදීහු" ලෙස හංවඩු ගසනු ලැබ සිටිති.

මේ නිසා රටත්, තරුණ පරම්පරාවත් මුහුණ දී තිබෙන සැබෑ ගැටලුවලට වර්තමාන පාලකයාට හෝ පාලනයට විසඳුම් සෙවිය නොහැකිය. ඒ බව ගත වූ මෙම සති කිහිපය තුළදීම ඔප්පු කර හමාරය. "නව" පාලනයද රට පාලනය කිරීමට සැරසෙන්නේ පරණ ප්‍රතිපත්ති මතමය. ඒ පැරණි අදූරදර්ශී හා දූෂිත පාලකයින් විසින්මය. දේශප්‍රේමී හීනයද, ස්මාර්ට් හීනය සේම හීනයක් වනවා නිසැකය.

මේ නිසා බොල් සිහින පල් කරන පාලනයක් හමුවේ, නිරවුල් ප්‍රතිපත්තියක් හා ප්‍රතිපත්ති ගරුක දේශපාලනයක වුවමනාව වැඩි වැඩියෙන් අපේ රටට වුවමනා වී ඇත. ඒ වෙනුවෙන් ශක්තිමත්ව රොද බැඳ ගනිමු..

## හොරා කෑ දේපළ...


================

බරට හොරා කෑ දේපළ කර පින්නා

මෙරට ඉඩම් දේපළ සුද්දට දුන්නා

සැරට පාට් දා හිටියට තරු පෙන්නා

හොරුට බයේ සී.අයි.ඩී.ය රට පැන්නා




## ටජ් මහලටත් වාතය පිරිසිදු කරන යන්ත්‍රයක්




ඉන්දියාවේ නවදිල්ලි නුවර ඇතුළු උතුරුදිග ඉන්දියාවේ ප්‍රදේශ රැසක හටගෙන තිබෙන වායුගෝලීය දූෂණ තත්වය හේතුවෙන් නව ක්‍රියාමාර්ග රැසක්ම ගැනීමට එරට බලධාරීන් පියවර ගෙන තිබේ. ඒ අනුව නවදිල්ලි නුවර සිට කිලෝමීටර 250ක් දුරින් පිහිටි එරට ඉහළ සංචාරක ආකර්ෂණයක් දිනා ඇති ටජ් මහල වෙත වායුව පිරිසිදු කරන යන්ත්‍ර රැගත් වෑන් රථ යැවීමට බලධාරීන් විසින් කටයුතු යොදා ඇත. මෙම වායු දූෂණ තත්වයට නිසා දිනෙන් දිනම රෝහල් වෙත පැමිණෙන ශ්වසන රෝගීන් සංඛ්‍යාව ඉහළ යමින් තිබේ. මේ වන විට මෙම අහිතකර වායුගෝලය නිසා නවදිල්ලියේ ඇතිව තිබෙන මීදුම් තත්වය චීනයේ බීජිං නුවර මෙන් තුන් ගුණයක් බව පැවසෙයි.

## පිරිසිදු වාතය, ජලය දිය නොහැකි ජනතාවට වන්දි ගෙවන්න - ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නියෝගයක්



දසලක්ෂ ගණනක් ජනතාව පීඩාවට පත්ව ඇත.

ජනතාවට අවශ්‍ය පිරිසිදු වාතය සහ ජලය ලබාදීමට එරට ප්‍රාන්ත රාජ්‍යන් අපොහොසත් වන්නේ නම් ඔවුන් එම ජනතාවට යම් වන්දි මුදලක් ගෙවිය යුතු බවට ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය නියෝගයක් ලබාදී තිබේ. දිල්ලි නුවර ඇති අහිතකර විෂ වායු දුමාරයන් හේතුවෙන් ඇතිව තිබෙන පරිසර දූෂණය නිසා

# ශක්තිමත් විපක්ෂයක කාර්යභාරයට පණපෙවීමට අපි සූදානම්



ජනතා විමුක්ති පෙරමුණේ නායක
**අනුර දිසානායක සහෝදරයා**

***නියමුවා:- 2019 ජනාධිපතිවරණය ජනතා අපේක්ෂාවන්හි බිඳවැටීමක්ද? තාවකාලික විතැන්වීමක් ද?***

***අනුර දිසානායක සහෝදරයා:-*** ජනාධිතිවරණ ප්‍රතිඵලය තුළ යම් පසුබෑමක් පෙන්නුම්කොට තිබෙනවා. ජනාධිපතිවරණයක් ප්‍රධාන වශයෙන් කඳවුරු දෙකක් අතර ගැටුමක් බවට පත්වුණා. මෙවර තිබෙන විශේෂය තමයි එම බල කඳවුරු දෙකෙන් ඔබ්බට ගියපු යම් දේශපාලන කඳවුරු දෙකක් බවට පරිවර්තනය වුණා. එක කඳවුරක් රට බේරාගැනීමේ මෙහෙයුමක් ලෙසත් අනෙක් කඳවුර ඒකාධිපතිත්වයට එරෙහි මෙහෙයුමක් ලෙසත් තමයි අර්ථකථනය වුණේ. ඒ නිසා මෙම බල බෙදීමේ තීව්‍රතාවයත් දේශපාලන තීව්‍රතාවයත් විසින් තුන්වෙනි කඳවුරකට සැලකිය යුතු පසුබෑමක් ඇති කරනවා. ඒ නිසා මෙය ජනාධිපතිවරණ තුළ විශේෂත්වයක් විතරයි.

මෙය නිශ්චිත වශයෙන්ම ජයග්‍රාහී දිසාවට ගෙන යා හැකියි. මැතිවරණ සංඛ්‍යා තොරතුරුවලින් නොපෙනෙන දේශපාලන ජයග්‍රහණ ගණනාවක් මේ තුළ තිබෙනවා. අපේ පක්ෂ ඉතිහාසය තුළ පුළුල්තම බලවේගය ගොඩනගලා, ජාතික ජන බලවේගය ගොඩනගා, එහි නායකත්වය රට පුරා තහවුරු කරන්න අපි සමත්වී තිබෙනවා. ඒ නිසාම අපිට පක්ෂයක් හැටියට රට ගොඩනැගීම පිළිබඳ සංවාදයක් රට තුළ ගොඩනැගීමට හැකියාවක් ලැබුණා. ඒ නිසා ඒවා අනාගත ආයෝජනයන් ලෙස පවතින බව පේනවා.

***නියමුවා:- ජනාධිපතිවරණ ප්‍රතිඵලය සමග ලාංකේය සමාජීය ධ්‍රැවීකරණය වී ඇති ආකාරයක් දක්නට ලැබෙනවා. මෙම තත්වය රටේ අනාගතයට කෙසේ බලපායිද?***

***අනුර දිසානායක සහෝදරයා:-*** ඔව්. විශේෂයෙන්ම මෙම මැතිවරණය, සමාජය ධ්‍රැවීකරණය කර තිබෙනවා. එකක් රට බේරා ගැනීම යැයි කියන ජාතිවාදය, අන්තවාදය, ආගම්වාදී දිසාවකට කේන්ද්‍රීය වූ කණ්ඩායමක් නිර්මාණය වී තිබෙනවා. එය දෙමළ ජාතිකත්වයට, මුස්ලිම් ජාතිකත්වයට එරෙහිව ගොඩනැගෙන කඳවුරක් ලෙස තමයි අර්ථකථනය වෙමින් තිබෙන්නේ. ඒ වගේම අනෙක් කඳවුර මෙම ගොඩනැගෙමින් තිබෙන ජාතිවාදය, ආගම්වාදයට, අන්තවාදයට එරෙහිව අනෙක් කඳවුර යම් ධ්‍රැවීකරණයකට ලක්වී තිබෙන බව මැතිවරණ ප්‍රතිඵලවලින් ඉතා පැහැදිලිව පෙන්නුම්කර තිබෙනවා.

රටක් එකතු වෙනවා කියන්නේ භූමියෙන් එකතුවීම නොවෙයි. රට තුළ ඉන්න විවිධ ජාතීන්, ආගම්, සංස්කෘතීන්වලට අයත් ජනතාවගේ එකතුවෙන් තමයි රට එකතුවෙනවා කියන්නේ. රටක් හැටියට අපි දන්නවා විවිධ ආගම්, විවිධ ජාතිකත්වයන්, ආගමික සංස්කෘතින් තිබෙනවා. අපේ රට ඉදිරියට ගෙන යා හැකිවන්නේ මෙම ආගම, සංස්කෘතිය, ජාතිකත්වයන් අතර කෙරෙන සාමූහික බැඳීමකින් පමණයි. එතකොට තමයි රටක් පවතින්නේ. ජනතාව බෙදෙන්න බෙදෙන්න රටකට එකට පවතින්න බැහැ. ගෝඨාභය සහ සජිත් දෙන්නගෙම ඡන්ද ඉදිරිපත් කරන සංඥාව ඒ තරම් යහපත් එකක් නොවෙයි.

ඒ නිසා මෙම තීව්‍ර බෙදීම අනාගතයේ සැලකිය යුතු විනාශකාරිත්වයක් කැඳවීමේ ඉඩකඩ තිබෙනවා. බලය ගත්තාට පසු මොහොත තුළ එම කණ්ඩායම් එම අත්තනෝමතික ජාතිවාදී, අන්තවාදී ස්වභාවයෙන් තමයි කටයුතු කරමින් තිබෙන්නේ. රටක් පවතින්නේ භූමියෙන් නොවෙයි; ජනතාව අතර එකතුවීමකින් පමණයි. ඒ නිසා මේ ධ්‍රැවීකරණය වීම අපේ රටේ අනාගතයට සැලකිය යුතු බලපෑමක් ඇතිකරන බව පැහැදිලියි.

***නියමුවා:- නව ජනාධිපතිවරයා විසින් කාර්යමණ්ඩලය සහ ඇමතිවරුන් පත්කරනු ලැබ තිබෙනවා. තවත් නියෝජ්‍ය හා රාජ්‍ය ඇමතිවරුන් පිරිසක් පත් කොට තිබෙනවා. මේ පිළිබඳව ඇතැමුන්ගේ අඳෝනා පළ වෙමින් තිබෙනවා. මේ පිළිබඳ ඔබේ කියවීම කවරාකාරද?***

***අනුර දිසානායක සහෝදරයා:-*** විශේෂයෙන්ම ඔවුන්ගේ දේශපාලන සංස්කෘතිය පවතින්නේ විවිධ වරදාන වරප්‍රසාද හා සතුටු කිරීම් මතයි. ඒ නිසා තවදුරටත් මෙම කඳවුරු දෙකේම අමාත්‍ය ධුර කියන්නේ එම විෂයයන් පිළිබඳ හොඳ අවබෝධයක් අත්දැකීමක්, එම විෂයයන් මෙහෙයවීම සඳහා හැකියාවක් අපේක්ෂා කරන, ජනතාවට කාර්යක්ෂම සේවයක් ලබා දෙන වගකීම් නෙමෙයි. ඒවා තමන්ගේ සමීපතමයාට වරදාන වරප්‍රසාද ලබාදෙන ව්‍යුහයන් බවට පත්වී තිබෙනවා. ඒ නිසාම තමයි මෙය අර්බුදයක් බවට පත්වුණේ. ආරම්භයේදීම ඇතැමුන් ඉතා විශාල ආශ්වාදයෙන් කථාකරන්න පටන් ගත්තා. ඒ, කුඩා කැබිනට් මණ්ඩලයක් ගොඩනැගුවා යැයි තර්ක කරමින්. නමුත් සිදුවී තිබෙන්නේ කුමක්ද? අමාත්‍යාංශ ගණන වැඩිවෙමින් තිබෙනවා. රාජ්‍ය අමාත්‍ය ධුර සංඛ්‍යාව වැඩිවී තිබෙනවා. ඒ වගේම විෂයයන් බෙදීම අතර කිසිදු විද්‍යාත්මක පදනමක් නැහැ. කෙනෙකුට බලශක්ති රාජ්‍ය ඇමති ධුරය දෙන අතර තවකෙකුට විදුලි බල රාජ්‍ය ආමාත්‍ය ධුරය ලබා දෙනවා. ඒ, එකිනෙකා සතුටු කිරීම වෙනුවෙනුයි. එහෙන් මෙහෙන් කෑලි කඩා සංතෝෂම් ලබාදීමේ ක්‍රියාවලියක් බවට මෙම අමාත්‍ය මණ්ඩලය පත්වී තිබෙනවා. ඔවුන් අනුගමනය කරන පැරණි දේශපාලන සංස්කෘතියේම දිගුවක් තමයි මේ පෙන්නුම් කර දී තිබෙන්නේ.

***නියමුවා:- රට විශාල ආර්ථික අර්බුදයක් අබියස තිබියෙදී 'නව පාලනයේ' 'නව ගමන' කෙසේ වේවිද?***

***අනුර දිසානායක සහෝදරයා:-*** ලංකාවේ බලයට පත්වූ හැම නායකයාම ආරම්භයේදී තමන් වෙනස් ලෙස පෙන්වීමට උත්සාහ කරලා තියෙනවා. සමහරු බෝල්පොයින්ට් පෑනෙන් අත්සන් කරලා වැඩ පටන් අරන් ගමන කෙළවර වුණේ කොහොමද කියලා අපිට අමතක නැහැ. විශේෂයෙන් ගෝඨාභය ජනාධිපතිවරයා විදිහට පත්වෙලා කරපු පත්කිරීම් කිහිපයක් අපි දැක්කා. ජනාධිපති ලේකම් පී.බී.ජයසුන්දර, ආරක්ෂක ලේකම්, කමල් ගුණරත්න වගේ අය. ඒ මගින් යම් ඉඟියක් සපයනවා ඉදිරි පාලනය පිළිබඳව. වසර ගණනාවක් අපේ රටේ ආර්ථිකය සම්බන්ධව වගකීම් දරපු කෙනෙක් තමයි පී.බී. ජයසුන්දර. අපි දන්නවා 1994 සිට දීර්ඝ කාලයක් අවුරුදු 20කට ආසන්න කාලයක් අපේ රටේ ආර්ථිකය මෙහෙයවනු ලැබුවේ පී.බී. ජයසුන්දර. අද වෙනකොට රට වැටිච්ච ආර්ථික අගාධයේ ප්‍රමාණයට ඔහු වගකිව යුතු පුද්ගලයෙක්. යළි ඔහුටම ආර්ථිකය බාරදීමේ ස්වභාවයක් තමයි මේ පෙන්නුම් කර තිබෙන්නේ. ආරක්ෂක ලේකම් කියන්නේ සුවිශේෂ වගකීමක්. මිලිටරි කෝණයෙන් බලලා ආරක්ෂාව ගැන හිතනවාට වඩා අද රටට අවශ්‍ය වෙලා තියෙන්නේ සමාජයක් විදිහට සාමූහිකව ආරක්ෂාව සලසා ගැන්වීමක්. ඒත් මොවුන්ගේ ආරක්ෂක දෘෂ්ටි කෝණයම මිලිටරිවාදී එකක්. කැබිනට් මණ්ඩලය පත්කිරීම ගත්තත් පැරණි මුහුණුවලට නව අමාත්‍යාංශ නාමකරණයන් එල්ලා තිබෙනවා. මාස තුන හතරක තාවකාලික ආණ්ඩුවක් වුණත් පනහකට වැඩි ඇමති මණ්ඩලයක් පත්කිරීමෙන් නව ආණ්ඩුව පැරණි ගමනටම එළඹ ඇති බව පෙනෙනවා.

ඒ අතර ඔහු ඔහුට ආවේණික වෙනස්කම් පෙන්නලා තියෙනවා. මැතිවරණයක් අබියස සිටින නිසා බදු ප්‍රතිසංස්කරණ කිහිපයක් යෝජනා කර තිබෙනවා. එහෙත් අපි ඒවා රට ඉදිරියට ගෙන යන ඉහළ සමාජීය ආර්ථික ප්‍රතිසංස්කරණ කියලා හිතන්නේ නැහැ. මතුපිට තලයේ යම් ප්‍රදර්ශනාත්මක කරුණු කීපයක් කෙටිකාලීනව කරන්න හැකි වුවත් ගැඹුරින්ම මුහුණ දී තිබෙන අර්බුදයට විසඳුම් සොයාගත නොහැකි වෙනවා. විශේෂයෙන්ම අපේ රටේ ණය පොලී වාරිකය ඉහළ යාම, නිෂ්පාදනය කඩා වැටීම, රාජ්‍ය ආදායම හීන වීම, ගමේ ජනතාවගේ ග්‍රාමීය ණය ගැතිභාවය ආදී විශාල ආර්ථිකය විසින් ඇතිකර තිබෙන පීඩනයන් තිබෙනවා. එනිසා එම පීඩනයන් සඳහා විසඳුමක් ලබාගැනීමට නම් ආර්ථික තලයේ ගැඹුරුම ප්‍රතිසංස්කරණයන් අවශ්‍යව තිබෙනවා. මම හිතන්නේ නැහැ එවැනි ප්‍රතිසංස්කරණයන්ට යා හැකි වේවි කියලා. ඒ නිසා මෙම අර්බුදය තාවකාලිකව, උඩින් පැලැස්තර අලවමින්, තල්ලු කරමින් යන, ගැඹුරින් කඩා වැටෙන ආර්ථිකයක්. එය වළක්වන්න බැහැ. හුඹහක් වගේ. උඩින් ගොඩනැගෙන, යටින් හිස්ව තිබෙන තත්වයකට තමයි පත්වී තිබෙන්නේ. ඒ නිසා මහ මැතිවරණය තෙක් යම් ප්‍රදර්ශනාත්මක සහන ප්‍රකාශයට පත් කළත් ඉතා කෙටිකලකදී රට දැවැන්ත ආර්ථික අර්බුදයකට පත්වෙන බව පැහැදිලියි.

> ජනතාවට දැන් පැවරී තිබෙන කාර්යභාරය තමයි එම පාලනයට එරෙහි විපක්ෂයේ කාර්යභාරය ශක්තිමත් කිරීම. ඒ නිසා එහෙට මෙහෙට පනින සල්ලිවලට විකිණෙන, පාවෙන කණ්ඩායමක් වෙනුවට ශක්තිමත් විපක්ෂයක් ගොඩනැගීමේ කාර්යභාරයට උරදිය යුතුයි. දැන් අපි එයට පණපොවන්න ඕනැකම තිබෙනවා.

***නියමුවා:- අපේක්ෂා කළ හැකි ලෙසම තවත් මාස කිහිපයකින් පාර්ලිමේන්තු මැතිවරණයක් එළඹීමට නියමිතයි. ඔබ දකින ආකාරයට රටේත් තමන්ගේත් හෙට දවස වෙනුවෙන් ජනතාවගේ වගකීම කෙබඳුද?***

***අනුර දිසානායක සහෝදරයා:-*** පසුගිය ජනාධිපතිවරණයේදී නව පාලනයක් ගොඩනගාගෙන තිබෙනවා, රටේ ජනතාව. ඒ පාලනයට අකමැතිද, කැමතිද කියන ප්‍රශ්නය කෙසේ වෙතත්, එය නව පාලනයක්. ඒ නිසා ජනතාවට දැන් පැවරී තිබෙන කාර්යභාරය තමයි එම පාලනයට එරෙහි විපක්ෂයේ කාර්යභාරය ශක්තිමත් කිරීම. ඒ නිසා එහෙට මෙහෙට පනින සල්ලිවලට විකිණෙන, පාවෙන කණ්ඩායමක් වෙනුවට ශක්තිමත් විපක්ෂයක් ගොඩනැගීමේ කාර්යභාරයට උරදිය යුතුයි. දැන් අපි එයට පණපොවන්න ඕනැකම තිබෙනවා.

මේ වන විට අපි විශාලම බහුජන ව්‍යාපාරය මේ රටේ ගොඩනගා තියෙනවා. ජාතික ජන බලවේගය රටේ දිගුකාලීන දේශපාලන පරිවර්තනයක් වෙනුවෙන් ක්‍රියාකරන ව්‍යාපාරයක්. නමුත් එළඹෙන මැතිවරණ වෙනුවෙන්ද අපි ජාතික ජන බලවේගය ලෙසම ඉදිරිපත් වී රටට ජයග්‍රහණ ගෙන ඒමට සූදානම්.

අපි ජනතාවට ආරාධනා කරනවා, ශක්තිමත් විපක්ෂයේ කාර්යභාරය සඳහා සහයෝගය ලබාදෙන ලෙස. ඒ සඳහා ජනතාව කටයුතු කරාවි යැයි අපි දැඩිසේ විශ්වාස කරනවා.

# මේ ගොඩනැගුණු එකතුවම ජයග්‍රහණයක්

### ජාතික ජන බලවේගයේ මාධ්‍ය ප්‍රකාශක නීතීඥ හර්ෂණ නානායක්කාර මහතා



ජාතික ජන බලවේගය වැනි ව්‍යාපාරයක් රටට අවශ්‍යම කාලයක් තමයි ඉදිරියට එළඹෙන්නේ. මේ මැතිවරනයේදී අපි ඡන්ද පදනම අතින් යම් පසුබෑමකට ලක්වුණත්, අපේක්ෂා කළ මට්ටම අපට නොලැබුණත් සෑහෙන සංවිධාන ප්‍රමාණයක් අප වටා ඒකරාශී වී තිබෙනවා. මේ සංවිධාන සමග ජාතික ජන බලවේගය ගොඩනැගුණේම ප්‍රජාතන්ත්‍රවාදය, ජාතික සමගිය, ජාතිවාදයට එරෙහි, දූෂණයට වංචාවට එරෙහි කඳවුරක් ලෙසයි. ඒ අරමුණ කරා යාමට මෙතැන සංවිධාන 34කට වැඩි ප්‍රමාණයක් නියෝජනය කරනවා. මෙතැනදී අප ලබපු විශාලම ජයග්‍රහණය තමයි, මෙතැනදී විවිධ වෘත්තික කණ්ඩායම්, සිවිල් සංවිධාන. දේශපාලන ක්‍රියාධරයන් එක වේදිකාවකට කැඳවීමට සමත්වීම. මේ ගොඩනැගුණු එකතුවම ජයග්‍රහණයක්.

මෙම මැතිවරණය බයවල් අතර තරගයක් බවට පත්වුණා. එක් පාර්ශ්වයක් විසින් අනෙක් පාර්ශ්වය බලයට පැමිණියහොත් කුමක් සිදුවේද යන්න මත, ජාතික ආරක්ෂාවට තර්ජනයක් සිදුවේද යන්න මත බියවැද්දීම් සිදු කළා. නාමයෝජනා දීමට පෙර සිටි ජනතාව මැතිවරණ ව්‍යාපාරය තුළ විශාල ලෙස වෙනස් වුණා. ඡන්දදායකයන්ට ප්‍රතිපත්ති අනුව තීරණ ගැනීමට හැකියාවක් ලැබුණේ නැහැ. රටට ගැලපෙන ප්‍රතිපත්ති ඉදිරිපත් කළේ ජාතික ජන බලවේගය පමණයි. නමුත් ඒ ප්‍රතිපත්ති අධ්‍යයනයක් කිසිවෙක් අතින් සිදුවුණේ නැහැ. එජාපයට හෝ ගෝඨාභයට ඡන්දය දුන් අය ප්‍රතිපත්ති කියවා, ඒ ගැන තෘප්තිමත්ව ඡන්දය දුන්නේයැයි අප සිතන්නේ නැහැ. මෙය හුදෙක්ම හැඟීම් අනුව මෙහෙයවුණු ඡන්දයක්. එවන් අවස්ථාවලදී අප ගත්තේ දුෂ්කර මාවතයි. එනම් ජනතාවට දැනුම ලබාදී, අප ගැන හඳුන්වා දී, රට යා යුතු මාවත පෙන්වා දී ඒ අනුව ජනතාව වෙනස් කිරීමේ කාර්තව්‍යයක්. මෙය හුදු ආණ්ඩවක් පිහිටුවීම හෝ ජනාධිපතිවරයෙක් පත් කිරීම නොමෙයි; පවතින ක්‍රම වෙනස් කිරීමේ භාරදූර කර්තව්‍යයක්. අප ඒ සඳහා ජාතිවාදය, ආගම්වාදය වැනි කිසිවක් භාවිත කරගත්තේ නැහැ. අපි සියලු ජනතාවගේ සංහිඳියාව මත පිහිටා සිටියා.

නමුත් මේ ඡන්දයේදී ජාතිවාදය නරක ලෙස පාවිච්චි වූ බව ඉතා පැහැදිලිව පෙනී ගියා. මැතිවරනයෙන් පසුව මුහුණපොතේ පළ කරන ලද පෝස්ට්වල මීගමුවේදී තමන්ගේ ඡන්ද අපේක්ෂකයා පැරදුණු බැවින් නැවත බෝම්බ ගැසිය යුතු බව පවසන මට්ටමකට ඇතැමුන් වැටී තිබුණා. යාපනය ගැන ඔවුන් පවසන දේ දෙස බැලීමෙනුත් මේ බව පැහැදිලියි. පෙර නොවූ විරූ ලෙස ජාති, ආගම් අතර බෙදීයාමක් මේ තුළ ඇතිවීමට පුළුවන්. එවන් අවස්ථාවක සත්‍යය කතා කරමින්, ජාතික සමගිය පිළිබඳව කතා කරමින් සිටින දේශපාලනය ව්‍යාපාරය ජාතික ජන බලවේගයයි. ඉදිරියටත් මේ රටේ අපට ඡන්දය දුන් නොදුන් සියලු ජනතාවට සිදුවන අසාධාරණකම්වලට එරෙහිව, සමාජ සාධාරණය වෙනුවෙන් නැගී සිටීමට හා කැපවීමේ හැකියාව අපට තිබෙනවා. යම් පාලකයෙක් හෝ ආණ්ඩුවක් විසින් ජනතාවගේ අයිතිවාසිකම්වලට හානිවන ආකාරයේ යමක් කළහොත් ප්‍රජාතන්ත්‍රවාදීව නැගී සිටිමින් ඔවුන් වෙනුවෙන් සටන් වැදීමට අපි සූදනම්.

# ජනතා අයිතිවාසිකම් රැකගැනීමේ සටන වෙනුවෙන් අප කැපවනවා

### එක්සත් වාමාංශික පෙරමුණේ ප්‍රධාන ලේකම් නීතීඥ ලාල් විජේනායක සහෝදරයා



අපි ජාතික ජන බලවේගය පිහිටවූවේ ජනාධිපතිවරණයට මුහුණ දීම සඳහා නෙමෙයි. ඊට වඩා අපට මුහුණ දී ඇති සමාජ, ආර්ථික හා දේහපාලන අර්බුදය විසඳීම සඳහා වන දීර්ඝ ගමනක් වෙනුවෙනුයි. ඒ අර්බුදය විසඳීම සඳහා ඩතාමත් විද්‍යාත්මකව සකස් කරන ලද වැඩපිළිවෙළක් ඉදිරිපත් කරමින් අපි ජාතික ජන බලවේගය ගොඩනැගුවා. අපි මේ මැතිවරණයට අවතීර්ණ වීමෙන් පසුව විකල්ප දේශපාලන වැඩපිළිවෙළක් ඉදිරිපත් කිරීමට අපට හැකියාව ලැබුණා. අනෙක් දේශපාලන පක්ෂ දෙකම එකයි; එකම දේශපාලනයයි. අප තෙවැනි බලවේගය නොව විකල්ප බලවේගයයි. මැතිවරණය තුළ අප වැඩපිළිවෙළ ජනතාව අතර සංවාදයට බඳුන් කළා. එය තවත් ඉදිරියට ගෙන යා යුතුව තිබෙනවා. විකල්ප බලවේගයක් ලෙස අප වෙත විශාල වගකීමක් පැවරී තිබෙනවා. රට තුළ පවතින සමාජ, දේශපාලන, ආර්ථික අර්බුදය දෙස බලන විට මර්දනය කිරීම්, ජනතාව මත බර පැටවීම්, දේශපාලන අර්බුද සිදුවීමට ඉඩ තිබෙනවා. එවැනි තත්වයක් තුළ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්, මානව හිමිකම්, අධිකරණයේ ස්වාධීනත්වය, නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කිරීමේ වගකීම අප මත පැටවනවා. එය ඉටුකිරීම අපේ ඓතිහාසික යුතුකමක්. ඒ සටන ඉදිරියට ගෙනයාමට අපි කැපවී සිටිනවා.

# 2019 ජනා

# රටත් ජනතාවත් අභියෝග අත්නොහරින බ

### ජාතික ජන බලවේ



**දේශපාලනයේ හැරවුම්. පසුබැසීම්, ව්‍යාකුල තත්වයන් ඇතිවීම් ඕනෑ තරම් තම ජීවිත කාලය තුළ අත්විඳ ඇති බව පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා, ඒ හැම මොහොතකම යළි යළිත් ශක්තිමත් වෙමින්, ධෛර්ය ලබාගනිමින්, මාවත හොඳින් විවෘත කරගනිමින් රටත් රටේ ජනතාවත් මුහුණ දී තිබෙන අභියෝගයෙන් මුදා ගැනීමේ වගකීම කිසිසේත් අත්නොහරින්නේ යැයි ප්‍රකාශ කළේය.**

අනුර දිසානායක සහෝදරයා මෙම අදහස් පළ කළේ 2019.11.16 දින පැවති ජනාධිපතිවරණයේ ප්‍රතිඵල නිකුත්වීමෙන් පසු 2019.11.18 දින බත්තරමුල්ල අවකාශ මධ්‍යස්ථානයේ පැවති ජාතික ජන බලවේගයේ මාධ්‍ය හමුවට එක්වෙමිනි. මෙම මාධ්‍ය හමුවේදී ජාතික ජන බලවේගයේ මාධ්‍ය ප්‍රකාශක නීතීඥ හර්ෂණ නානායක්කාර, එක්සත් වාමාංශික පෙරමුණේ ප්‍රධාන ලේකම් නීතීඥ ලාල් විජේනායක, ජන නියමු කලාකරුවෝ සංවිධානයේ සාහිත්‍යවේදී ජයතිලක කම්මැල්ලවීර, විප්ලවවාදී සමාජවාදී කේන්ද්‍රයේ වසන්ත දිසානායක යන මහත්වරුද කරුණු දැක්වූ අතර මෙහි දැක්වෙන්නේ ඒ අදහස්වල ලිඛිත සටහනයි.

මැතිවරණ ව්‍යාපාරයට අවතීර්ණ වුණ
මෙම මැතිවරණ ප්‍රතිඵලය තුළ එම ප්‍ර
අපි දන්නවා, ලංකාවේ මෙතෙක් පැව
නාඩගම්කාරී වේදිකා අපි දැක තිබෙන
රට ගොඩනැගීම පිළිබඳ සංවාදයත් මේ
පිළිබඳ අසීරුතාවයත්, ජනතාව මුහුණ
ගැනීම සඳහා තිබෙන මාවතත් අපි ඉ
දුන්නා. ප්‍රතිඵලය කවරක් වුවත් අපි වි
ජනතාවටත් ගත යුතු මාවත වන්නේ,
බව. ආර්ථික සංවර්ධනය සඳහා, ප්‍රජාත
යහපත් සංස්කෘතියක් නිර්මාණය කිරීම
අතර සමගිය නිර්මාණය කිරීම සඳහා,
තහවුරු කිරීම සඳහා ඇති මාවත ජාති
දෙන ලද මාවත පමණක් බව අපි විශ්
ව්‍යාපාරය තුළ කවර හැඩයක් පෙන්නු
යුතු මාවත අප විසින් පෙන්වා දී තිබෙ

ඒ වගේම අපි දන්නවා, මේ මැතිව
හැකි තත්වය පිළිබඳව අප හැම දොන
ආර්ථික වශයෙන් අපේ රට ගමන් කළ
ප්‍රජාතන්ත්‍රවාදයට එල්ල විය හැක්කේ
මුස්ලිම් ජනයා අතර සමගිය වර්ධනය
අවිශ්වාසය, ගැටුම තව තවත් වර්ධනය
හොඳින් පෙන්නුම් කරමින් තිබෙනවා.
ආරක්ෂාව වෙනුවෙනුත් රටේ ජනතාව
නොසැලී සටන් කරන බවට අපි සපථ
එන බව මේ රටේ ජනතාවට ප්‍රකාශ ක
කරමින් ආ ප්‍රතිපත්ති අපේ රට ගෙනැ
අපේ රට ගෙනයා හැක්කේ කොතැනට
වෙමින් තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය ව
අප ඉදිරිපිට ඇති සාකච්ඡා මණ්ඩපය



අප ජාතික ජන බලවේගය ලෙස මෙම ජනාධිපතිවරණයට ඉදිරිපත් වුණා. මෙතෙක් ලංකාවේ දේහපාලන වේදිකාවලට ගොඩ නොවැදුණු කණ්ඩායම් විශාල ප්‍රමාණයක් අපට දායකත්වය ලබා දුන්නා. විශ්වවිද්‍යාල ආචාරයවරුන්, නීතීඥවරුන්, සාහිත්‍යධරයින්, කලාකරුවන්, සාමාජක්‍රියාකාරීන් ආදී විශාල පිරිසක් අපේ මැතිවරණ ව්‍යාපාරයට සම්බන්ධ වුණා. අපිට අපේක්ෂාසහගත ඉලක්කයක් තිබුණා. ජනාධිපතිවරණයට ප්‍රධාන කඳවරු දෙකක් පෙළ ගැසී ඇති වෙලාවක මැතිවරණ ව්‍යාපාරය කෙතරම් දුෂ්කරද, අසීරුද යන්න අපි හොඳින්ම දැන සිටියා. ඒ බව දැනගෙනමයි අපි

අනතුර ඉතා හොඳින් අපට පෙන්වා දී
පෙනී යමින් තිබෙන්නේ සිංහල-දෙමළ
අවිශ්වාසය වර්ධනය වන තත්වයක් ඇ

අප විසින් ඒ නිසා අන් කවරදාකට
කළ දේශපාලනය, අප විසින් පෙන්වා
මේ රටේ ජනතාවටත් ඉදිරි ගමන් මාව
නිසා හෙට දවසේද ඒ ගමන් මාවත

**මෙම හමුවේදී මාධ්‍යවේදීන් විසින් නැගූ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් අනුර දිසානායක සහෝදරයා විසින් පළ කළ අදහස් මෙසේය.**

<u>ඔබතුමන්ලා වගේම අපිත් මීට වඩා හොඳ ප්‍රතිඵලයක් බලාපොරොත්තු වුණා. ඔබතුමාලට තිබෙන කැමැත්ත කතිරයට හරවන්න බැරිවෙලා තිබෙනවා. ඔබතුමාලා පාර්ලිමේන්තුවේ ඉන්න ඕනෑ. මේ ගැන පසුවිපරමක් අවශ්‍ය නැද්ද?</u>

මේ ජනාධිපතිවරණ ප්‍රතිඵලය ගැන සමාලෝචනයක් කරගත යුතුව තිබෙනවා. එම කිසිදු සමාලෝචනයකදී අපි වෙනස් නොකරගත යුතු කරුණු කිහිපයක් තිබෙනවා. අපි කිසිසේත් ජාතිවාදයට වැටෙන්නේ නැහැ. අතිශය දුෂ්කර තත්වයක් හමුවේ වුවද ජාතික සමගිය වෙනුවෙන් පෙනී ඉන්නවා. ඒ වගේම දේශපාලන න්‍යායපත්‍රයේ කොතනකවත් ආගම හෝ අන්තවාදය කොටසක් කර ගන්නේ නැහැ. මහජනයාගේ දේපොළ සොරාකන දූෂණයේ යොදන දේශපාලනයේ අපි නිරත වෙන්නේ නැහැ. රටේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යූහයන් ශක්තිමත් කරනවා වෙනුවට ප්‍රජාතන්ත්‍රවාදය හකුළුවමින් යම් රාජාභිෂේකයක් දක්වා ඔසවන දේශපාලනයක නිරත වන්නේ නැහැ. මේ ස්ථාවරයන් අපි වෙනස් කරගන්න සූදානම් නැහැ.

මේ මැතිවරණය ස්වභාවයෙන්ම කඳවුරු දෙකක් ඇතිවන තීව්‍ර සටනක් බව අපි දන්නවා. එනිසා ඡන්ද ධ්‍රැවීකරණය වීම වළක්වන්න බැහැ. ගොඩක් අය වාර්තා කළ සාමකාමී ප්‍රචණ්ඩත්වයෙන් තොර මැතිවරණයක් කියලා. නමුත් අපි විශ්වාස කරන්නේ අපේ රටේ මැතිවරණ ප්‍රචණ්ඩත්වය ස්මාර්ට් වෙලා තිබෙනවා. එක යුගයක තිබුණා ගෙවල්වලට ගිහින් ඡන්ද කාඩ්පත් පැහැරගෙන අනෙකා වෙනුවෙන් තව කෙනෙක් ඡන්දය පාවිච්චි කළා. අනෙක් ආකාරය ඡන්ද දායකයින් පලවා හැරලා ඡන්ද පෙට්ටි පිරවීම. ඒ වගේම පෙට්ටිය පිටින්ම මාරු කළ ප්‍රචණ්ඩ ක්‍රියා දැකලා තිබෙනවා. මේ සියලු දෙයින් සිදුවන්නේ ජනතාවගේ කැමැත්ත සාධාරණ ලෙස පිළිබිඹු වෙන එක වළක්වාලීම. මෙවරත් එහෙම වුණා. ජනතාවගේ කැමැත්ත ඇත්ත ලෙස පිළිබිඹු වීමට රාජ්‍ය හා පුද්ගලික නාලිකා කිහිපයක් ඉඩ දුන්නේ නැහැ. ඇත්ත ගත්තොත් රාජ්‍ය නාලිකාවල සමාජ බලපෑම හීන වෙලා තිබෙන තත්වයක් තුළ නාලිකා කිහිපයක් තම පටු දේශපාලන වුවමනාවන් වෙනුවෙන් ජනතාවගේ කැමැත්ත මත බලපෑමක් ඇති කොට තිබෙනවා. මාධ්‍ය අසත්‍ය කීම ප්‍රශ්නයක් නොවේ. මොකද එය නිවැරදි කරන්න පුළුවන්. භයානක දේ තමයි මාධ්‍ය ජනතාව මත වැරදි පරාවර්තනයන් ඇති කිරීම. පල්ලියක කඩු ඇති බව වාර්තා කිරීම ප්‍රශ්නයක් නොවේ. නමුත් මාධ්‍ය විසින් එය කඩු තබා ගත්තේ උඹලට ගහන්න කියලා ජනතාව මත වැරදි මතයක් ඇති කිරීම භයානකයි. ඒ වගේම මැතිවරණ ව්‍යාපාරයේ කටයුතු පෙන්වන්න පුළුවන්. නමුත් යම් පුද්ගලයෙක් ජයග්‍රහණය කරන බව, ඔහු ජයග්‍රහණය නොකළහොත් රටට අහිතකරයි යනුවෙන් පරාවර්තනයක් ඇති කිරීම භයානකයි. ඒ වගේම අනෙක් පුද්ගලයෙක් ජයග්‍රහණය කරන්නේ නැහැ ජයග්‍රහණය කළහොත් රටට විනාශකාරිත්වයක් ඇති වෙයි කියලා පරාවර්තනය කිරීම භයානකයි. ඒ වගේම මේ අය ඡන්ද ව්‍යාපාරයට අදාළ නැහැ කියලා පරාවර්තනය කිරීම භයානකයි. මැතිවරණ කොමසාරිස්තුමත් ප්‍රකාශයට පත් කරලා

# ධිපතිවරණය

## යෙන් මුදා ගැනීමේ වගකීම
## ව සපථ කරනවා

### ර්ගයේ ජනාධිපති ධුර අපේක්ෂක, ජනතා විමුක්ති පෙරමුණේ නායක
### අනුර දිසානායක සහෝදරයා

ේ. අපි යම් ප්‍රතිඵලයක් අපේක්ෂා කළා.
ිඵලය නොමැති බව පැහැදිලියි. නමුත්
ති මැතිවරණ ව්‍යාපාර තුළ විකටජනක,
වා. එවැනි තත්වයක් තුළ තමයි අපි
ම් රට ගොඩගැනීම
 දී තිබෙන ගැටලු සහ එය විසඳා
ා හොඳින් ජනතාවට පෙන්වා
ශ්වාස කරනවා මේ රටටත් රටේ
අප විසින් පෙන්වා දෙන ලද මාවත
න්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා,
 සඳහා, සිංහල-දෙමළ-මුස්ලිම් ජනයා
 රටේ හා මහජනයාගේ ආරක්ෂාව
ක ජන බලවේගය විසින් පෙන්වා
ාස කරනවා. ඒ මාවත හැර මැතිවරණ
ම් කර තිබුණත් ජනතාවට තෝරා ගත
නවා.
රණ ව්‍යාපාරයෙන් පසුව රටේ අතිවිය
ටම පූර්ව අවබෝධයක් තිබෙනවා.
 හැක්කේ කවර දිශාවකටද?
කවර තර්ජනයක්ද? සිංහල-දෙමළ-
 කරනවා වෙනුවට ඔවුන් අතර සැකය,
 කිරීමේ දිශාවට යන බව ඉතා
 ඒ නිසා මේ රටේ හා ජනතාවගේ
ගේ අයිතිවාසිකම් වෙනුවෙනුත් අපි
 කරනවා. ඒ වෙනුවෙන් ඉදිරියට
රනවා. මන්ද 71 වසරක් අනුගමනය
විත් තිබෙන්නේ කොතැනටද, ඒවාට
ද යන්න අප ඉදිරියේ විද්‍යමාන
ර්ධනය කළ හැකිද? හැකිළිය හැකිද?
ප්‍රජාතන්ත්‍රවාදයට එල්ල විය හැකි

හැරීමකින් තොරව සටන් වදින්නත් ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීමටත් සූදානම් බව අප මේ ජනතාවට ප්‍රකාශ කිරීමට කැමතියි.

ඒ වගේම මැතිවරණ ව්‍යාපාරය තුළ පුළුල් බලවේගයක් නිර්මාණය කරගැනීමට අපට හැකියාව ලැබුණා. දේශපාලන පක්ෂ, සිවිල් සංවිධාන, සිවිල් ක්‍රියාධරයන්, කලාකරුවන්, සාහිත්‍යධරයන්, වෘත්තීයවේදීන් ආදීන් විශාල පිරිසකගෙන් සමන්විත බලවේගයක් අප නිර්මාණය කර ගත්තා. මා විශ්වාසය කරනවා එම බලවේගය කවරදාවත් තමන්ට කිසිවක් අපේක්ෂා කරන ලද කණ්ඩායමක් නෙමෙයි. මේ රටත් මේ රටේ ජනතාවත් මුහුණදී තිබෙන ගැඹුරුතම අර්බුදයන්ගෙන් මේ රට ගොඩගැනීම සඳහා වූ අවංක වුවමනාවක් ඔවුනට තිබුණා. මේ ක්‍රියාධරයින් අප හා සමාන ලෙසම මේ ව්‍යාපාරය තුළ විශාල වැඩ කොටසක් කළා. මෙම මැතිවරණ ව්‍යාපාරය සාර්ථකව ඉදිරියට ගෙනයාමට ඔවුන් දැක්වූ දායකත්වය පිළිබඳව මම ඔවුනට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. ඔවුන් දිවා රෑ නොතකා ගම්, නගරවල ඇවිදිමින් පුරවැසියන් මුණගැසෙමින් මේ දේශපාලන කර්තව්‍යය වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටු කළා. ජාතික ජන බලවේගය ලෙස ඒ සියලුම දෙනාට අප ස්තූතිවන්ත වෙනවා.

මේ මැතිවරණ ව්‍යාපාරය තුළ තීව්‍ර බෙදීමක් සටහන් වුණා. මැතිවරණ ප්‍රතිඵලය තුළත් එය පෙන්නුම් කරමින් තිබෙනවා. එක් කණ්ඩායමක් ජාතිවාදය තමන්ගේ පදනම බවට පත් කරගනිමින් රටේ හා ජනතාවගේ ආරක්ෂාවේ ප්‍රමුඛයන් බවට පත් වෙමින් දේශපාලන මතවාදයක් ව්‍යාප්ත කළා. දකුණේ මැතිවරණ ප්‍රතිඵලය තුළින් පෙන්නුම් කරමින් තිබෙන්නේ එයයි. ඒ වගේම උතුරේ හා නැගෙනහිර ජනතාව ඒ ඇතිවෙන දේශපාලන වර්ධනය සමාජයක් ලෙස තමන්ගේ පැවැත්මට තර්ජනයක් ලෙස තේරුම් ගත්තා. ඔවුන් එයින් ආරක්ෂාවීම සඳහා සමාජයක් ලෙස දේශපාලන තීන්දුවකට එළඹුණු බව පේනවා. මේ මැතිවරණ ප්‍රතිඵලය තුළින් ඒ බව පැහැදිලියි. එවැනි තීව්‍ර බෙදීමක් තුළත් ලක්ෂ 04කට අධික ජනතාවක් අප කෙරෙහි විශ්වාසය තබා ඡන්දය ප්‍රකාශ කර තිබෙනවා. ඒ සියලු ජනතාවට අපි ස්තූතිවන්ත වෙනවා. එපමණක් නෙමෙයි. ඔවුන් අප කෙරෙහි විශ්වාසය තබා, ප්‍රකාශ කරන ලද ඡන්දයේ ගරුත්වය, වටිනාකම අප විසින් ලබා දෙන බවටත් ආරක්ෂා කරන බවටත් සහතිකයක් අප රටේ ජනතාවට ලබා දෙනවා.




 තිබෙනවා. මැතිවරණයෙන් පසුව
ළ-මුස්ලිම් ජනතාව අතර සැකය
ති වී ඇති බවයි.
වත් වඩා වැඩියෙන් අප විසින් ඉදිරිපත්
 දෙන ලද ගමන් මාවත මේ රටත්
ත වන බව ඉතාම පැහැදිලියි. ඒ
වනුවෙන් කිසිදු පසුබැසීමකින්, අපසු

නැවත වරක් මේ රටේ ජනතාවගෙන් ඉල්ලා සිටීමට තිබෙන්නේ දේශපාලනයේ හැරවුම්. පසුබැසීම්, ව්‍යාකූල තත්වයන් ඇතිවීම් ඕනෑ තරම් ජීවිත කාලය තුළ අප විසින් අත්විඳ තිබෙනවා. කෙසේ වුවද ඒ හැම මොහොතකම යළි යළිත් අප ශක්තිමත් වෙමින්, ධෛර්ය ලබාග නිමින්, යළි යළිත් මාවත හොඳින් විවෘත කරගනිමින් මේ රටත් මේ රටේ ජනතාවත් මුහුණ දී තිබෙන අභියෝගයෙන් මුදා ගැනීමේ වගකීම කිසිසේත් අත්නොහරින බව මේ රටේ පොදු ජනතාවට අප ප්‍රකාශයට පත් කරනවා.

# යහපත් සමාජයක් දැකීම වෙනුවෙන් කලාකරුවන් ඉදිරියටත් නොසැලී වැඩ කරනවා

### ජන නියමු කලාකරුවෝ සංවිධානයේ සාහිත්‍යවේදී ජයතිලක කම්මැල්ලවීර මහතා



අප සියලු දෙනා, සියලුම මාධ්‍ය ආයතන දැන සිටියා, අප විසින් ඉදිරිපත් කරන ලද අදහස් කවදා හෝ මේ රටේ සාධාරණ, සමගියෙන් යුතු, සමාජයක් බිහි කර ගැනීම සඳහා ඉදිරිපත් කළ හොඳම යෝජනා බව. නමුත් මාධ්‍ය ආයතන මගින්, විශේෂයෙන් විද්‍යුත් මාධ්‍ය මගින් සාධාරණ සහයෝගයක් ලැබුණේ නැහැ. ඒ ගැන අපි කණගාටු වෙනවා. මාධ්‍යවේදීන් හෘදය සාක්ෂියට අනුව වැඩ කළහොත් මේ රට බේරාගත හැකියි. අද මේ රට ජනාධිපතිවරනයේ ප්‍රතිඵල අනුව නරක බෙදීමකට ලක්ව තිබෙනවා. මුස්ලිම් සමාජය, සිංහල සමාජයෙන් එල්ල විය හැකි ප්‍රහාරවලින් ආරක්ෂා වීම සැලකිල්ලට ගෙන ඡන්දය ප්‍රකාශ කර තිබෙනවා. දෙමළ සමාජය මීට වසර 5-6කට පෙර තිබුණු හමුදා පාලනයට ආපසු යන්නට තිබෙන අකමැත්ත සහ එයින් ගැලවීමේ මාර්ගය ලෙස සලකමින් තමන්ගේ ඡන්දය පාවිච්චි කර තිබෙනවා. සිංහල සමාජය දෙමළ හා මුස්ලිම් අන්තවාදී සංවිධානවලින් ගැලවීම සඳහා, එවායින් එල්ල විය හැකි ප්‍රහාර පිළිබඳව ඇති භීතිය මුල් කරගෙන ඡන්දය ප්‍රකාශ කර තිබෙනවා.

මෙම තත්වය තුළ සමාජයට ලැබෙන ප්‍රතිඵල ඉතාම නරකයි. සියලු දෙනාගේ භීතිය එලෙසම ඉතිරි වී තිබෙනවා. මේ භිතිය තුරන් කිරීම සඳහා තිබිය හැකි එකම මාර්ගය ජාතික සමගියයි. අද ජාතික සමගිය පිළිබඳව කථා කිරීමට පවා නොහැකි තත්වයකට සමාජය පත්වී තිබෙනවා. එජාප ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්තියට වැඩි වෙනසක් මේ නව බලාධිකාරියෙන් අපට බලපොරොත්තු වෙන්න බැහැ. මැතිවරණ ව්‍යාපාරයේදී රටේ ප්‍රවීණ කලාකරුවන් විශාලම ප්‍රමාණය ඒකරාශි වුණේ අප සමගයි. කලාකරුවන් 140 ගණනක් කිසිදු වරප්‍රසාදයක්, ආර්ථික වාසියක් අපේක්ෂා නොකර අප සමග අත්වැල් බැඳගත්තා. ඒ සියලු දෙනා ඉදිරියේදීත් මේ රටේ යහපත් සමාජයක් දැකීම වෙනුවෙන් නොසැලී වැඩ කරන බව ජන නියමු කලාකරුවෝ සංවිධානයේ උපදේශ මණ්ඩලයේ කෙනෙකු ලෙස ප්‍රකාශ කිරීමට කැමතියි.

# අනාගතයේ ජයගත හැකි බව අපට විශ්වාසයි

### විප්ලවවාදී සමාජවාදී කේන්ද්‍රයේ වසන්ත දිසානායක සහෝදරයා



ඇත්ත වශයෙන් අපේ සහෝදරවරු බලාපොරොත්තු වුණා මීට වඩා ප්‍රතිඵලයක්. නමුත් අපි අපේක්ෂා කළ ප්‍රතිඵලය ජනතාව විසින් ලබාදුන්නේ නැහැ. වෙනසක් අපේක්ෂා කරපු සැලකිය යුතු බලවේගයක් රටේ හිටියා කියන එක රහසක් නොවේ. නමුත් ඒ වෙනස අපේක්ෂාවෙන් හිටපු ඒ ජනතාව ආකර්ෂණය කරන්න අපි කිසියම් දුරකට අසමත් වුණාය කියන එක තමා මේ ප්‍රතිඵලයෙන් පෙන්නුම් කරන්නේ. ඇත්තටම මේ වෙනසක් අපේක්ෂා කරපු ජනතාව අපට පණිවුඩයක් දීල තියෙන්නේ. ඔබ අප වෙනුවෙන් සෑහෙන කැපවීමකින් වැඩ කළාට අපව ප්‍රමාණවත් ලෙස දිනාගැනීමට ඔබ අසමත් වෙලාය කියන පණිවිඩය තමා දී තියෙන්නේ.

ඒ නිසා අප ජාතික ජන බලවේගය විදියට අපේ වගකීමක් තිබෙනවා අපිට ඇයි මේ එකතු කරගන්න බැරිවුණේ කියන කාරණය. ගොඩක් හේතු තියෙනවා. ඒ කියන්නේ මේ අපේ සහෝදරවරු විස්තර කරපු අපි දැකපු අපිට බාධක විදියට තිබ්බ බොහෝ කාරණා තියෙනවා. ඒවා අපි කැමතිවුණත් නැතත් ඉදිරියටත් හැමදාමත් මේ ක්‍රමය පවතිනතාක් කල් තියෙනවා. ඉතින් අපේ පැත්තෙන් අපේ වගකීම වෙන්නේ මේවා මෙසේ තිබියෙදී අපි කොහොමද මේවා අභිබවා යන්නේ. අභිබවා යමින් ජනතාවට අපේ පණිවිඩය දෙන්නේ ජනතාව අපි දිනාගන්නේ කොහොමද කියන එක. මෙතනදී මම හිතන්නේ අපි කල්පනා කරනවා, ජාතික ජන බලවේගය විදියට මේ කාර්ය සපුරා ගන්නේ කොහොමද කියන එක පිළිබඳ බරපතළ විදියට සැලකිල්ලට ගෙන ඒ කාරණා නිවැරැදි කරගන්න. අසමත් වූ කාරණා යළි ක්‍රියාකාරිත්වයට පත්කරලා සාර්ථක බලවේගයක් බවට පත්වෙන්න කටයුතු කිරීම අපට පැවරී තියෙනවා.

ඒ සඳහා ඉදිරියේදී අපි කටයුතු කිරීම අවශ්‍ය වෙනවා. විශේෂයෙන්ම මේ පාලනය වෙනස් වුණා කියලා මේ රටේ තියෙන කිසිදු ප්‍රශ්නයකට විසඳුමක් ලැබෙන්නේ නැහැ. අපි මේ ජනපතිවරණ ව්‍යාපාරය තුළ නිරන්තරයෙන් අවධාරණය කළා වගේ වාගේම අපේ අනිකුත් ක්‍රියාකාරීන් අවධාරණය කළා වගේම මේ කිසිදු පාලකයකුට මේ ප්‍රශ්නවලට විසඳුම් සපයන්න බැහැ. ඒ නිසා වැඩිකල් නොයා මේ පාලකයන්ගේ එල්ලවෙන නොයෙකුත් අභියෝගයන්ට මේ රටේ ජනතාවට මුහුණ දෙන්න සිදුවෙනවා. ඉතින් ඒ නිසා මේ විදියේ ව්‍යාපාරයක් නැතිවම බැරි ව්‍යාපාරයක් විදියට පවතිනවා. ඒ නිසා අපි මේ අවස්ථාවේ යම්කිසි පසුබෑමටකට ලක්වුණාට අනාගතයේදී ජනතාව අපව ආමන්ත්‍රණය කරන තත්වයකට පත්වෙනවා. ඒ ආමන්ත්‍රණයට නිසි පිළිතුරු දීම අපේ වගකීම වෙනවා. ජයගන්න අපට පුළුවන් කියල අපි විශ්වාස කරනවා.

තිබුණා මාධ්‍ය නාලිකාවලට මන්ත්‍රීවරුන් පත්කරලා එවන්න කියලා. එය ප්‍රකාශයට පත්කිරීම ගැන එකඟයි. නමුත් ඒ සඳහා මැදිහත්වීම ප්‍රමාණවත් නැහැ. අපි හිතනවා ජන මනස වෙනස් කිරීම සඳහා විශාල තලයකට මාධ්‍ය නාලිකා ගමන්කොට තිබෙනවා. අපි පසුවිපරමේදී සොයා බැලිය යුතු වෙනවා මෙවැනි මාධ්‍ය හැසිරීමකදී අපේ මතය ජනතාව අතරට ගෙන යන උපක්‍රම මොනවාද කියලා.

**ඔබතුමාලාගේ වැඩපිළිවෙළ ගැන ප්‍රශ්නයක් නැහැ. ඡන්දය ලබාගැනීම පිළිබඳව තමයි සමාලෝචනයක් කළ යුත්තේ.**

ඔව්. අපි ඉදිරියේදී සමාලෝචනයක් කර බලමු. අපේ ව්‍යාපාරයේ සාධනීය ඉදිරි පියවර වෙනුවෙන් කවුරු හරි යෝජනාවක් ඉදිරිපත් කරනවානම් අපි එය භාරගන්න සූදානම්. ඒ වගේම අපේ ක්‍රියාකාරකම් ඉදිරි ගමනට බාධා වෙලා තිබෙනවා යැයි කියා කවුරු හරි කෙනෙක් නිෂේධනීය දේ පෙන්වා දෙන්නේ නම් ඒකත් අපි භාරගන්න ලෑස්තියි. මොකද අපි හිතනවා කවුරු මැතිවරණ වේදිකාවේ බල්ටි ගැසුවත් අපේ රටේත් ජනතාවගේත් ඉදිරිය තීරණය වන්නේ ජාතික ජන බලවේගය මත කියලා. ඒ නිසා අපි බැහැර කළ යුතු දේ බැහැර කරන්න එකතු කර ගත යුතු දේ එකතු කරගන්න අපි සූදානම්.

**මාධ්‍ය නියාමනය පිළිබඳව ඔබතුමාලාගේ ස්ථාවරය මොකක්ද?**

පළමුකොටම අපි මේ මාධ්‍ය නාලිකා ජනතාවට එළිදරව් කළ යුතුයි. ඔවුන්ම එළිදරව් වෙමින් තිබෙනවා. පළමු මැතිවරණ ප්‍රතිඵලය එනකොටම යම් මාධ්‍ය නාලිකාවක හිමිකරුවෙක් උද්දාමයෙන් දඟලන ආකාරය අපි සමාජ මාධ්‍යවල දැක්කා. එම මාධ්‍ය නාලිකාව කොතරම් බලපෑමක් කළාද යන සතුට තමයි ඒ පෙන්වන්නේ. එනිසා මේ තත්වය සමාජයේ කතාබහට ලක්වෙන්න ඕනෑ. කවර හෝ මාධ්‍ය ආයතනයක් අධිකාරී බලයක් සහිතව ජනතාවගේ මතයට බලපෑමක් කරනවානම් මාධ්‍යයට අපිව විවේචනය කරන්න අයිතිය තිබෙනවා සේම දේශපාලන ව්‍යාපාරයක් ලෙස අපිටත් අයිතියක් තිබෙනවා ඔවුන් විවේචනයට භාජනය කරන්න. අනෙක් එක නීතිමය ප්‍රතිපාදන. එය අපි මතම තීරණය වන්නේ නැහැ. එය ටිකක් දුරින් තිබෙන දෙයක්.

ඒ වගේම අපි ජනතාවට කියන්න උත්සහ කරන අදහස තිබියදී එම මාධ්‍ය නාලිකාවට ජනතාවට ගෙනියන්න අවශ්‍ය අදහස අපේ කතාවෙන් කොටසක් යොදාගෙන ගෙනියනවා. කොහොම වුණත් ඔබ මාධ්‍යවේදීන් ලෙස ඔබ වැඩකරන ආයතනය තුළ ඔබටත් සංවාදයක් තිබෙනවා. ඔබ එකඟද ඔබගේ ආයතනය හැසිරුණු ආකාරය පිළිබඳව. ඔබටත් ඒ පිළිබඳව සේවකයකුගෙන් එහාට ගිය වගකීමක් තිබෙනවා. එනිසා නීති සම්පාදනයට වඩා ජනතාව අතර සංවාදයක් තමයි වැදගත් වෙන්නේ.

**ඔබතුමා නායකත්වයට පත්වීමෙන් පසුව ජවිපෙ ඡන්ද ප්‍රමාණය අඩු වුණා කියලා චෝදනාවක් තිබෙනවා. ඔබ එය පිළිගන්නවාද?**

අපේ දේශපාලන ව්‍යාපාරය 2015දී යම් ප්‍රමාණයක ඉදිරියට එනවා. පාර්ලිමේන්තු මන්ත්‍රී ධුර තුනේ සිට හය දක්වා වැඩිවෙනවා. 2018 පළාත්පාලන මැතිවරණයේදී මන්ත්‍රීවරුන් දෙගුණයකට ආසන්න ප්‍රමාණයකට වැඩි කර ගන්නවා. ප්‍රතිඵලවල වර්ධනයන් තිබෙනවා,

# බ්‍රිතාන්‍ය මහ මැතිවරණයට ගිය චාගෝස් දූපත්




මොරිෂස් ජනරජයේ චාගෝස් දිවයින් මත සිය ආධිපත්‍යය අවසන් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් බ්‍රිතාන්‍යයට ලබාදී තිබූ මාස 06ක කාලය පසුගිය නොවැම්බර් 22 වන දාතමින් අවසන් විය. එසේ වුවද බ්‍රිතාන්‍යය එකී දූපත්වල අයිතිය මොරිෂස් ජනරජය වෙත පවරා දීමට පියවර ගත්තේ නැත.

2019 මැයි 23 වැනි දින එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 'වහාම' චාගෝස් දිවයින් පෙළ මොරිෂස් ජනරජය වෙත පවරා දෙන ලෙසට යෝජනාවක් සම්මත කර ගත්තේය. මෙම යෝජනාව අප්‍රිකානු රටවල් විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානය හමුවේ ඉදිරිපත් කරන ලද්දකි. එහිදී රටවල් 193න් අතිමහත් බහුතරය, එනම් රටවල් 116ක් ඊට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළහ. ඒ අනුව මාස 06ක් ඇතුළත බ්‍රිතාන්‍යය සිය යටත්විජිතවාදී පාලනය චාගෝස් දිවයින් වෙතින් ඉවත් කරගත යුතු විය. බ්‍රිතාන්‍යය එක්සත් ජනපදය ඇතුළු රටවල් 06ක් මෙකී යෝජනාවට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළ අතර ප්‍රංශය, කැනඩාව හා ජර්මනිය ඇතුළු රටවල් 55ක් ඡන්දය දීමෙන් වැළකී සිටියහ.

බ්‍රිතාන්‍ය යටත්විජිතයක්ව පැවති මොරිෂස් දිවයින්වලට 1965 දී 'නිදහස' ලබාදෙද්දී බ්‍රිතාන්‍යය චාගෝස් දිවයින් පද්ධතිය මොරිෂස් දිවයින්වලින් වෙන්කොට ඒවා තමන් යටතේම තවදුරටත් පවත්වාගෙන යාමට කටයුතු කළාය. පසුව බ්‍රිතාන්‍යය මෙම දූපත් සමූහයේ විශාලතම දූපත වූ දියාගෝ ගාර්ෂියාව යුද කඳවුරක් පවත්වාගෙන යාම සඳහා එක්සත් ජනපදයට ලබාදෙනු ලැබිණි. ඒ අනුව දියාගෝ ගාර්ෂියා දූපතෙහි විසූ 2000ක පමණ වූ ස්වදේශික වැසියන් ඉන් පිටුවහල් කොට එහි දැවැන්ත ගුවන් හමුදා කඳවුරක් පිහිටුවීමට කටයුතු කෙරිණි. සෝවියට් දේශය ප්‍රමුඛ සමාජවාදී රාජ්‍ය පද්ධතිය පැවති සීතල යුධ කාලවකවානුවේ එය උපක්‍රමික වශයෙන් වැදගත් එක්සත් ජනපද යුද කඳවුරක් විය. ඊට පසුව ඇෆ්ගනිස්ථානයට එරෙහි යුද්ධයේදීත්, ඉරාකයට එරෙහි යුද්ධයේදීත් එක්සත් ජනපදය මෙම යුද කඳවුර භාවිතා කළ අතර 2001 සැප්තැම්බර් ප්‍රහාරයෙන් පසු එය CIA සංවිධානයේ ප්‍රශ්න කිරීමේ මධ්‍යස්ථානයක් වශයෙන්ද යොදා ගන්නා ලදී.

2019 පෙබරවාරියේදී ජාත්‍යන්තර අධිකරණය විසින් තීන්දු කරනු ලැබුවේ මොරිෂස් ජනරජයෙන් චාගෝස් දිවයින් වෙන්කිරීම ජාත්‍යන්තර නීතියට පටහැණි බවත් එය යළි මොරිෂස් ජනරජයට භාරදිය යුතු බවත්ය. එහෙත් බ්‍රිතාන්‍යය එම තීන්දුව අනුව කටයුතු කිරීම ප්‍රතික්ෂේප කළ බැවින් මෙම ගැටලුව එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙත ගෙනයාමට සිදුවිය.

චාගෝස් දිවයින් තුළ බ්‍රිතාන්‍ය පාලනය අවසන් කිරීමේ මාස 06ක කාලය ඉකුත්වීමෙන් පසු නිවේදනක් නිකුත් කළ අප්‍රිකානු සංගමය චාගෝස් දිවයින් තුළ බ්‍රිතාන්‍ය යටත්විජිත පාලනය තවදුරටත් පවත්වාගෙන යාම අවසන් කරන ලෙස ඉල්ලා සිටියේය. එහෙත් ඊට පිළිතුරු සපයමින් බ්‍රිතාන්‍ය කියා සිටින්නේ 1814 වසරේ සිටම චාගෝස් දිවයින් සමූහය බ්‍රිතාන්‍යයේ ඉන්දියන් සාගර භූමි ප්‍රදේශයක් ලෙස පැවති බවය. මොරිෂස් ජනරජයට එහි අයිතියක් නොමැති බවය. එහෙත් දියාගෝ ගාර්ෂියා දූපත තුළ එක්සත් ජනපද යුද කඳවුර පිහිටුවීමේදී එම දිවයින තුළ වාසය කළ වැසියන් පිටුවහල් කරනු ලැබුවේ මොරිෂස් දිවයින් වෙතය.

මේ අතර ඉදිරි මාසයේදී පැවැත්වීමට නියමිත බ්‍රිතාන්‍ය මහ මැතිවරණය තුළද මෙකී ප්‍රශ්නය සාකච්ඡාවට ලක්වෙමින් තිබේ. ඉදිරි මැතිවරණයට තරග කරන බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක ජෙරමි කොබින් ප්‍රකාශ කළේ මෙවර මහ මැතිවරණයේදී ඔහු අගමැති ලෙස තේරී පත්වුවහොත් චාගෝස් දිවයින් පෙළ යළිත් මොරිෂස් ජනරජය වෙත පවරා දෙන බවයි.

## බ්‍රිතාන්‍යය: සරසවි සේවකයෝ වැටුප් අරගලයක




බ්‍රිතාන්‍ය විශ්විද්‍යාල කාර්යමණ්ඩල පසුගිය නොවැම්බර් 25 වන සඳුදා සිට දින 08ක වැඩවර්ජනයක් ආරම්භ කළහ. මෙම වැඩවර්ජනයට බ්‍රිතාන්‍යය පුරා විසිරුණ විශ්වවිද්‍යාල 60 පමණ සේවකයෝ 40,000කට වැඩි පිරිසක් සම්බන්ධ වූහ.

විශ්‍රාම වැටුප සඳහා වැටුපෙන් කපාගනු ලබන කොටස වැඩිකිරීම හේතුවෙන් තමන්ට අතට ලැබෙන වැටුප අඩුවී ඇති බැවින් වහාම තමන්ගේ වැටුප වැඩිකරන ලෙසත්, කාන්තාවන්, සුළු ජාතිකයන්, ආබාධිතයන්ගේ වැටුප් අතර ඇති වෙනස වහාම නැතිකරන ලෙසත් ඔවුහු මෙහිදී ඉල්ලා සිටිති.

මෙම වැඩවර්ජනයට ප්‍රතිචාර නොදැක්වුවහොත් මීට වඩා දැවැන්ත ක්‍රියාමාර්ගයන් වෙත ඔවුන් අවතීර්ණ වන බවද ඔවුහු පවසා සිටිති.

## ඉරාන: ගැටුම් පිටුපස ඇමරිකාව බවට චෝදනා



උද්ඝෝෂණ හා කැරලි කෝලාහල ඇති කිරීමට සහායදීම මගින් ඉරානය තුළ අස්ථාවරත්වයක් ඇති කිරීමට කටයුතු කරන්නේ යැයි ඉරාන රජය පසුගියදා ඇමෙරිකා එක්සත් ජනපදයට චෝදනා කළේය.

නොවැම්බර් 15වැනි දින සිට ඉරාන ආණ්ඩුව එරට ඛනිජ තෙල් මිල ඉහළ දැමූ අතර, ඛනිජ තෙල් සලාක ක්‍රමයක් යටතේ ලබාදීමට කටයුතු කරන ලදී. ඒ සමගම ඉරානයේ නගර කිහිපයකම උද්ඝෝෂණ හා ප්‍රචණ්ඩ ක්‍රියා ආරම්භ විය.

ඉරාන රජය චෝදනා කරන්නේ මෙම විරෝධතා පිටුපස එක්සත් ජනපදය සිටින බවයි. ඉරානය තුළ වැඩි වැඩියෙන් කැරලි කෝලාහල සහ ප්‍රචණ්ඩ ක්‍රියා ඇති කිරීම එක්සත් ජනපදයේ වුවමනාව බව ඉරානය පවසයි. මේ අතර ඉරානය CIA නියෝජිතයන් යැයි සැකකොට පුද්ගලයන් 08 දෙනෙකු මේ වන විට අත්අඩංගුවට ගෙන තිබේ.

## නෙදර්ලන්තය: සෞඛ්‍ය ක්ෂේත්‍රය සටන් මඟට




නොවැම්බර් 20 වන බදාදා නෙදර්ලන්තයේ දහස් ගණනක් සෞඛ්‍ය සේවකයෝ වැඩවර්ජනයක නිරත වූහ. එකී වැඩවර්ජනයට වෛද්‍යවරුන්, හෙදියන්, රසායනාගාර ශිල්පීන්, රෝහල් උපස්ථායකයන් ඇතුළු සෑම ක්ෂේත්‍රයකම පිරිස් සහභාගි වූහ. ඔවුහු 5%ක වැටුප් වැඩිවීමක් සහ රැකියාවෙහි යහපත් වටපිටාවක් ගොඩනඟන ලෙස රජයට බලකර සිටිති. මෙම වැඩවර්ජනය කැඳවනු ලැබුවේ නෙදර්ලන්තයේ වෘත්තීය සමිති සම්මේලනය මගිනි.

මෙම වැඩවර්ජනයට සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සෑම අංශයකම සේවකයන් 150,000ක් පමණ සහභාගි වී යයිද ඔවුන් රට පුරා විසිරුණු රෝහල් 80ක සහ බහුසායන 32ක් නියෝජනය කරන්නන් වූ බවද වාර්තා වේ. තවද, ඔවුන් විසින් නෙදර්ලන්තයේ නගර කිහිපයකම විරෝධතා රැලිද සංවිධානය කර තිබිණි.

# එක්සත් ජනපදයෙන් බොලීවියාවට රෑකඩ පාලනයක්



බොලීවියාවේ පැවති අධිරාජ්‍ය විරෝධී, ප්‍රගතිශීලී පාලනයට එරෙහිව එක්සත් ජනපදයේ සහායෙන් ක්‍රියාත්මක කෙරුණ කුමන්ත්‍රණකාරී වැඩපිළිවෙළ තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතී. ඔක්තෝබර් 20වැනි දින පැවති ජනාධිපතිවරණයෙන් ජයගත් ජනාධිපති ඉවෝ මොරාලේස් මේ වන විට මෙක්සිකෝවේ දේශපාලන රැකවරණ ලබමින් සිටී.

ජනාධිපතිවරණයෙන් ඉවෝ මොරාලේස් හිටපු ජනාධිපතිවරයා ජයග්‍රහණය කළද එක්සත් ජනපදයේ සහාය ලබන දක්ෂිණාංශික විරුද්ධ පක්ෂය ඊට විරෝධය පළකරමින් විරෝධතා ආරම්භ කළේය. එහිදී ආරක්ෂක අංශවල සහායද විරුද්ධ පක්ෂය වෙත ලැබුණ බැවින් පසුගිය නොවැම්බර් 10 වැනිදා ජනාධිපති ඉවෝ මොරාලේස්ට දේශපාලන රැකවරණ පතා මෙක්සිකෝවට පැමිණීමට සිදුවිය. මීට අමතරව දක්ෂිණාංශික විපක්ෂ බලවේග ජනාධිපති ඉවෝ මොරාලේස්ගේ පක්ෂය වන සමාජවාදය සඳහා වන ව්‍යාපාරයේ නායකත්වයටද වහාම තනතුරු අත්හරින ලෙසට විවිධාකාරයෙන් බලපෑම් කරන්නට පටන් ගත්හ. නොවැම්බර් 12 වන දින දක්ෂිණාංශික විපක්ෂයේ ජීනයින් ඇනස්, ඉවෝ මොරාලේස්ගේ සමාජවාදය සඳහා වන ව්‍යාපාරයේ සාමාජිකයන්ට පාර්ලිමේන්තුවට ඇතුළුවීමට ඉඩ නොතබමින්, පාර්ලිමේන්තුවේ ගණ පූරණයද නොමැති තත්වයන් තුළ තමා බොලීවියාවේ ජනාධිපතිවරයා ලෙසත් නම්කර ගත්තාය.

මේ සමගම ඉවෝ මොරාලේස්ට හිතවත් පිරිස් බොලීවියාවේ දක්ෂාණාංශික පාලනයට එරෙහිව විරෝධතාවලට එළඹුණි. මෙම විරෝධතාකරුවන් වීදි බැස රටපුරා මාර්ග 83ක් පමණ වසා දමමින් විරෝධතාවල යෙදුණි. එකී විරෝධතාවලට ආරක්ෂණ අංශ පහර දීමෙන් මේ වන විට පුද්ගලයන් 30කට ආසන්න පිරිසක් මියගොස් ඇති අතර, 715කට ආසන්න පිරිසක් තුවාල ලබා ඇතැයි වාර්තා වේ. තවද විවිධ ආයතනවල කම්කරුවන්ද දක්ෂිණාංශික පාලනයට එරෙහිව වැඩවර්ජන ආරම්භ කර තිබේ.

ඉවෝ මොරාලේස් අවුරුදු 14ක් බොලීවියාවේ ජනාධිපතිවරයා ලෙස කටයුතු කළ අතර, ඔහු බොලීවියාවේ ජනාධිපති ධුරයට පත් ප්‍රථම ස්වදේශික පුද්ගලයාද වේ. ඔහුගේ පාලන කාලය තුළදී සාමාන්‍ය ජනතාවට සහන රැසක් ලබාදුන් අතර ලතින් ඇමෙරිකානු කලාපය තුළ වේගවත්ම ආර්ථික සංවර්ධනයක් සහිත රට බවටද පත්විය.

මේ වන විට ස්වයං ප්‍රකාශිතව බොලිවියාවේ අන්තර්කාලීන ජනාධිපතිවරිය ලෙස කටයුතු කරන ජීනයින් ඇනස් බොලීවියාවේ විදේශ ප්‍රතිපත්තිය වහාම වෙනස් කරන ලද අතර, කියුබාව සහ වෙනිසියුලාව සමග තානාපති සබඳතාද අත්හැර දමන ලදී. එසේම වෙනිසියුලානු විරුද්ධ පක්ෂ නායක ජුවාන් ගු අයිඩෝ වෙනිසියුලානු ජනාධිපතිවරයා ලෙස තමන් පිළිගන්නා බව ප්‍රකාශ කළාය. මේ අතර වසර 11කට පසුව බොලීවියාව එක්සත් ජනපද තානාපතිවරයෙකු පත්කිරීමටද කටයුතු කළාය.

බොලීවියාවේ අධිරාජ්‍ය විරෝධී, ප්‍රගතිශීලී ඉවෝ මොරාලේස් පාලනය බිඳ වැට්ටවීම කලාපය තුළ එක්සත් ජනපද මැදිහත්වීමේ නවතම ප්‍රතිඵලයයි. පසුගිය කාලය මුළුල්ලේම ලතින් ඇමෙරිකානු කලාපය තුළ බිහිවූ අධිරාජ්‍ය විරෝධී ප්‍රගතිශීලී පාලකයන් ගණනාවක්ම එක්සත් ජනපදය මැදිහත්වී බිඳ දමනු ලැබිණි.

# ගෝඨාභය ආර්ථික භයට උත්තර සෙවීමේ අභියෝගය




දැන් ජනතාවට මොනවා නැතත් 'ඉන්න රටක්' හදාගත්තේ මේ ජනාධිපතිවරණයෙනි. ඉන්න රටක් ඕනෑ නිසා විදෙස් ගතව රැකියා කරන අයද ලංකාවට පැමිණ ඡන්දය භාවිතා කරනු ජනමාධ්‍ය විසින් වාර්තා කරන ලදී. මහා සංඝරත්නයේ පිරිසක් විසින්ද මාස කිහිපයක් බුදු බණ සංශෝධනය කරමින් ඉන්න රටක් හදාගැනීමට ජනතාවට "ඡන්ද බණ" දේශනා කරන ලදී. මාධ්‍යද "ඉන්න රටක් හදා ගැනීමට" ඡන්දය දෙන හැටි ජනතාවට කියා දෙන ලදී.

අවසානයේදී ජනාධිපතිවරණ ප්‍රතිඵල අනුව ඉන්න රටක් හදා ගැනීම වෙනුවෙන් ගෝඨාභය රාජපක්ෂට වැඩි ඡන්ද ලක්ෂ 13 කින් ජනාධිපති ධුරය ජනතාව විසින් බාර දී ඇත. එම ජනතා කැමැත්තට අපි ඉඩ දිය යුතුය.

ජනාධිපතිවරණයේ ප්‍රතිඵලය දැන් ජනතාවටම කැවුම් කිරිබත් කා ප්‍රීතිවන තරමටය. ඒ තරමටම ජනතාව මෙම ප්‍රතිඵලයෙන් සැහීමට පත්ව ඇත. ඊළඟට සිහිනයෙන් අවදිවීමට සිදුවන කාලය එළඹේ. ඒ කිරිබත් කෑ කටින්ම ආණ්ඩුවට බනිමින් දෙස් දෙවොල් නොකියා සැබෑ ආර්ථික දේශපාලන සමාජ අර්බුදයන්ට විසඳුම් සෙවිය යුතුව ඇත.

තම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ හරයට ගෝඨාභය රජපක්ෂ වගකිව යුතු අතර ඒ වෙනුවෙන් ඡන්දය භාවිතා කළ ජනතාවටද ඊටත් වැඩි වගකීමක් පැවරී ඇත. මේ දිනවල නව රජ්ජුරුවන් ඉතා හොඳ කෙනෙකු යැයි ඇඟැයීමට ලක්වෙමින් තිබෙන්නේ මතුපිට ඉතා සරල සිල්ලර කාරණා වෙනුවෙනි.

ගෝඨාභය වැඩ භාරග න්නා දිනයේ අත්සන් කළ පෑන පිළිවෙළට පෑන් ඇසුරුමේ තබා පෙට්ටිය වැසීම ඉන් එකකි. එයින් අමන්දානන්දයට ලක්වූ "මාධ්‍ය" එය ප්‍රචාරය කරන්නේ "දැක්කා නේද විනය?" යැයි අසමිනි. එයත් විනයේ කොටසකි. රුවන්වැලි සෑයේ රතු පලසේ සෙරෙප්පු නැතිව යන දර්ශනයද එවැන්නකි. එය සසඳන්නේ හිටපු ජනාධිපති සොයුරු මහින්ද රාජපක්ෂ තවමත් සපත්තු දාගෙන ඒ පලස මතින්ම යන ඡායාරූපයක්ද පෙන්වමින් "දැක්කා නේද මහින්ද වගේද ගෝඨාභයගේ හැදියාව?" කියමින් කලින් ඔවුන් වන්දනාමාන කළ ලොකු රාජපක්ෂද හැල්ලු කරමිනි.

තවත් මාධ්‍යයකට වැඩ භාරගන්නා දිනයේ ගාලු මුවදොර පාර වැසීමක් නොකිරීමද තමන්ගේ මුහුණ ඡායාරූප වෙනුවට රාජ්‍ය ලාංඡනය පමණක් කාර්යාලවල ප්‍රදර්ශනය කිරීමද මහා විස්මකර්ම ක්‍රියාමාර්ග යන්ය. ඇත්තය. මොකුත්ම නැති තැනකදී ඒවාද මහා ලොකු දේවල්ය. නමුත් ඇත්ත ප්‍රශ්නය ඇත්තේ එතන නොවේය. ගෝඨාභය රාජපක්ෂ පාලනය පැවැති හා අදටත්, ඉදිරියටත් පවතින දැවැන්ත ආර්ථික අර්බුදයට පිළියම් සොයන්නේ කෙසේද යන්නය.

## ගෝඨා අභියෝග

ගෝඨාභය ජනාධිපති හමුවේ ඇති ලොකුම අභියෝගය වන්නේ ඡායාරූපය වෙනුවට රාජ්‍ය ලාංඡනය මාරු කිරීමවත්, ගාලුමුවදොර පාර විවෘතව තබා ගැනීමවත් නොව දැනට පවතින දැවැන්ත ආර්ථික අර්බුදයට විසඳුම් කෙටි කාලීනවත්, දිගුකාලීනවත් සොයා ගැනීමයි. විශේෂයෙන්, ණය අර්බුදයට ජාතික සම්පත් විකිණීමෙන් තොරව පිළිතුරක් සොයාගැනීම, ණය වාරික හා පොලී ගෙවීම, බැංකු පොලී අනුපාත ස්ථාවරව තබා ගැනීම, ව්‍යාපාරික ප්‍රජාවට තැලීමකින් තොරව රාජ්‍ය ආදායම වැඩිකර ගැනීම, ආනයන - අපනයන පරතරයට විසඳුම සෙවීම, රුපියලේ අගය ස්ථාවර කර ගැනීම, ආදායම බෙදීයාමේ විෂමතාවය අවම කිරීම, රාජ්‍ය ආයතනවල පිළිකාවක් සේ පැතිරී ඇති නාස්තිය හා දූෂණය අවම කිරීම මේ අතර ප්‍රධාන වේ. මෙම අභියෝග යන්ට මුහුණ දෙන ස්වභාවය අනුව ගෝඨාභයගේද අනාගත දේශපාලන කේන්ද්‍රය ලියවෙනු ඇත.

## "සෞභාග්‍යයේ දැක්ම"

"සෞභාග්‍යයේ දැක්ම" ගෝඨාභය ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනයයි. ඔහුට ඡන්දය දුන් ලක්ෂ හැටනවයෙන් අඩු තරමේ එක ලක්ෂයකවත් ඔහුගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ එක වගන්තියක්වත් කියවා ඡන්දය දුන්නේ දැයි සැක සහිතය.

> ගෝඨාභය ජනාධිපති හමුවේ ඇති ලොකුම අභියෝගය වන්නේ ඡායාරූපය වෙනුවට රාජ්‍ය ලාංඡනය මාරු කිරීමවත්, ගාලුමුවදොර පාර විවෘතව තබා ගැනීමවත් නොව දැනට පවතින දැවැන්ත ආර්ථික අර්බුදයට විසඳුම් කෙටි කාලීනවත්, දිගුකාලීනවත් සොයා ගැනීමයි. විශේෂයෙන්, ණය අර්බුදයට ජාතික සම්පත් විකිණීමෙන් තොරව පිළිතුරක් සොයාගැනීම, ණය වාරික හා පොලී ගෙවීම, බැංකු පොලී අනුපාත ස්ථාවරව තබා ගැනීම, ව්‍යාපාරික ප්‍රජාවට තැලීමකින් තොරව රාජ්‍ය ආදායම වැඩිකර ගැනීම, ආනයන - අපනයන පරතරයට විසඳුම සෙවීම, රුපියලේ අගය ස්ථාවර කර ගැනීම, ආදායම බෙදීයාමේ විෂමතාවය අවම කිරීම, රාජ්‍ය ආයතනවල පිළිකාවක් සේ පැතිරී ඇති නාස්තිය හා දූෂණය අවම කිරීම මේ අතර ප්‍රධාන වේ.

නමුත් ඔහු ජනාධිපති ලෙස ලිඛිතව ජනතාව සමග බැඳී ඇති ගිවිසුම මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනයයි. එහි "රට තියෙන තැන" කොටසේ ඉතා පැහැදිලිව වත්මන් ආර්ථික අර්බුදය විග්‍රහ කර ඇත.

ගෝඨාභයගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ රට තියෙන තැන අනුව අද වනවිට විදේශ ණය බර 2018දී ඇ.ඩොලර් බිලියන 32.6කි. එය 2014 දී අ. ඩොලර් බිලියන 23.7කි. දැන්නම් එය 38%ක ඉහළ අගයකි. ඔහුගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේම සඳහන් පරිදි 2019 අගවන විට පැවැතිය යුතු විදේශ වත්කම් සංචිතය අඩු තරමේ ඩොලර් බිලියන 13.2කි. නමුත් ඇත්තේ ඩොලර් බිලියන 06කි. ඒ අනුව සංචිත හිඟය බිලියන 7.2කි. දැන් පෑන පෙට්ටියේ පිළිවෙළට ඇසිරීමෙත් පමණක් ඉතිරි හිඟයට උත්තර නොලැබේ. ඒ සඳහා ඉදිරි සැලැස්ම රටට ඉදිරිපත් කළ යුතුව ඇත. රටේ අපේක්ෂාව ණය වෙලා හරි ඉන්න රටක් තියෙනවා කියන එක නම් ඒකට ගෝඨා අවශ්‍ය නැත. රනිල් - මෛත්‍රී හවුල් පාලනය ණය වූ රට ඉදිරියටම ගෙනවිත් තිබුණි. "ඉන්න රටක් තියෙන්න ඕනෑ" නිසා ජනතාව ඡන්දය දුන්නේ ණය නැති රටක් වෙනුවෙනි.

## රාජ්‍ය ආදායම් අර්බුදය

1977 දී විවෘත ආර්ථිකය හඳුන්වා දෙන විට රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් 24%කි. එය අද වනවිට 11% මට්ටමට දෙගුණයකින් කඩා වැටී ඇත. එයට ප්‍රධාන හේතුව නිෂ්පාදන ආර්ථිකය කඩා වැටීමයි. දෙවැන්න බදු ප්‍රතිපත්ති ඇතුළු අකාර්යක්ෂම මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැගීමයි. විවෘත ආර්ථිකය හඳුන්වා දෙන මොහොතේ සිටම මේ දක්වාම බදු ප්‍රතිපත්තියේ 88%ක්ම වක්‍ර බදු ලෙස ජනතාවගේ කරමතට අධිකව බදු බරක් පටවයි. ජනතාව ඉන්න රටක් තියෙන්න ඕනෑ යැයි වාක්‍යයකින් කියන්නේ තවදුරටත් මේ බදු බර දරාගත නොහැකිය යන පණිවුඩයද සහිතවය. මේ මොහොතේ ජාතිවාදී හැඟීමට වහල්භාවයට යටත් වූ ජනතාව ඉදිරි වසර පහ තුළම එම ජාතිවාදී හා යටත්, වහල් මානසිකත්වයේම ගිල්වා තබා ගත නොහැකිය. එයින් මිදෙන පළමු ආශ්වාසයේදීම ඔවුන් "ඉන්න රටක් ඕනෑ" යැයි කියන්නේ බදු බර, ණය බර, බැංකු හා මූල්‍ය සමාගම්වල ග්‍රහණයෙන් මිදුණු රටක් බව තේරුම් ගනු ඇත. එවිට එක්කෝ ගෝඨාභය ප්‍රශ්නය විසඳුම දිශාවට පියවර ගෙන තිබිය යුතුය. නැතිනම් කමල් ගුණරත්නගේ "සේනාංක" කැඳවිය යුතුය.

මැතිවරණ වේදිකාවලත්, ප්‍රතිපත්ති ප්‍රකාශනයන්ගෙන් ඉහළින්ම සාකච්ඡා කෙරුණු තවත් ප්‍රධාන මාතෘකාවක් වූයේ "නාස්තිය දූෂණය වැළැක්වීමයි" දැනුත් එය වලංගුය. සමහරු නාස්තිය ගැන කථා කරන්නේ ජනාධිපති පදවි ප්‍රාප්තියට දරන ලද වියදම වැඩිය යන අර්ථයෙන්ය. නැතිනම් කෑගල්ල ඩිපෝවේ බස් මුදල් නොගෙවා මේ ජනාධිපතිගේ ගෝලයොත් ගෙන ගියා යන සරල විවේචනයෙනි. එවැනි සරල කරුණු මත නොව, මහ බැංකු බැඳුම්කර වංචාව, ශ්‍රීලංකන් ගුවන් සමාගමේ, විදුලි බල මණ්ඩලයේ, තෙල් සංස්ථාවේ, වරාය තුළ ඇති දැවැන්ත පාඩුවල එකතුව බිලියන 1971ක්ය යැයි ගෝඨාභය රාජපක්ෂගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේම සඳහන්ය. වැදගත් වන්නේ එම අතිවිශාල පාඩු වැළැක්වීමේ නව ජනාධිපතිගේ හා පාලනයේ ක්‍රියාමාර්ග මොනවාද යන්නය.

## ප්‍රතික්ෂේපිත අපේක්ෂාව

ජනතාවගේ ජනමතය ගෝඨාභය රාජපක්ෂ බව ඉතා පැහැදිලිය. එසේම අනුර කුමාර දිසානායක ඉදිරිපත් කළ ජාතික ජන බලවේගයේ "දේශයේ අපේක්ෂාව" ජනතාව මේ මොහොතේ ප්‍රතික්ෂේප කර ඇත. එක්සත් ජාතික පක්ෂයේ, පොදු ජන පෙරමුණේන් ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනයන්ට වඩා බොහෝ යථාර්ථවාදී විසඳුම් ප්‍රමාණයක් සහිතව ප්‍රතිපත්තිමය සංවාදයක් රට තුළ ගොඩනැගීමට "දේශයේ අපේක්ෂාව" ප්‍රතිපත්ති ප්‍රකාශනයට හැකි විය. ඡන්ද ප්‍රමාණයෙන් පිළිබිඹු නොවුනද අට වැදෑරුම් ක්ෂේත්‍ර තුළ සාකච්ඡාවට ලක් කෙරුණු "දේශයේ අපේක්ෂාව" ප්‍රතිපත්ති ජාතිවාදී හා බියවැද්දීමේ පහත් දේශපාලන චර්යාවන් හමුවේ යටපත් වුවද ඉදිරියටත් වලංගු හා ප්‍රායෝගික ප්‍රතිපත්ති බව හැම ඡන්දය දුන් නොදුන් බුද්ධිමත් ප්‍රජාවගේ හෘදය සාක්ෂිය තුළ පවතී.

ගෝඨාභය ආර්ථික භයට උත්තර සොයන තරමට පැවැත්ම තහවුරු වන අතරම ජනතාවද තම දැනුමෙන් අවබෝධ කර නොගත් බොහෝ සත්‍යයන් ප්‍රායෝගික අත්දැකීමෙන් ඉදිරියේදී වටහා ගනු ඇත.



"අපි වේලාසනින් අවදි වුණොමු. එහෙත් වේලාසනින් අවදි වූ පමණින් වේලාසනින් හිරු පායන්නේ නැත. නමුත් කවදා හෝ දිනෙක හිරු පායද්දී වේලාසනින් අවදි වී සිටීම අපට ප්‍රයෝජනවත්ව තිබෙනු ඇත."

**රෝහණ විජේවීර**

කවුළුව හැරම් තබමි

# දුන් පණිවුඩය වටහා ගන්නා තුරු...




තම අනාගත පරපුරද යදමින් බැඳ විලංගුලා මේ නරුම පාලකයන්ටම පවරා දෙන්නෙකු නොවේද?

ඉල් මාසය යනු ජ.වි.පෙ.ට පමණක් නොව රටටම බොහෝ හොඳ දේ අහිමි වූ මාසයකි. ඉල් මහ විරුවන්ගේ ප්‍රයත්නය සාර්ථක වූයේ නම්, අද අපට අපේ රට ගැන කථාකරන බොහෝ අසුභ දේ කථාකිරීමට අපිට සිදු නොවෙනු ඇත. ලාංකේය සමාජයට නැණ පහන දැල්වීමට සිටි ඒ අසහාය මිනිසා රෝහණ විජේවීර සහෝදරයා ඇතුළු හැටදහසක පමණ විරු සගයන් හතුරා විසින් අපෙන් උදුරා ගත් මාසය වන්නේ ඉල් මාසයයි. එදා සතුරා අපෙන් බොහෝ දේ උදුරා ගත්තද ඔවුනට ඉල් මහ විරුවන් අපට දායාද කළ ජ.වි.පෙ දේශපාලන ප්‍රවාහයත් ඒ වටා රොද බඳින විප්ලවවාදීන්ගේ ධෛර්යයත් පැහැර ගත නොහැකි විය.

1989 ඉල් මාසයේ සතුරා විසින් රටට අහිමි කළේ ඉතිහාසයේ එක් පරිච්ඡේදයකි. එහි ප්‍රතිවිපාක අදටද අපි භුක්ති විඳිමින් සිටිමු. ඉල් මහ විරුවන් දුන් පණිවුඩය මේ වනතුරුත් අපේ රටේ ජනතාව වටහාගෙන නොතිබීමෙන් කියා පාන්නේ කුමක්ද? අපි දෙපා තබා තිබෙන තැන පිළිබඳ වටහා ගැනීමට එම නොවැටහීමම ප්‍රමාණවත්ය.

ඉල් මහ විරුවන් සටන් වැදුණේ දේශපාලන වහලුන්ගෙන් සහ දේශපාලන ප්‍රවේණිදාසයන්ගෙන් තොර රටක් වෙනුවෙනි. එහෙත් වහලෙකු තම ගෙල බැඳි යදම ආභරණයක් සේ සලකන්නේ නම් ඔහු

# නරක දේවල්ම ඉල්ලාගෙන කෑම




මේ රටේ ඡන්දදායකයන් නරක දෙයක් වෙනුවට හොඳ දෙයක් තේරීමට හැමදාම පාහේ අසමත් වූහ. ඒ අසමත්භාවය ඔවුන් විසින් උපරිමයට පෙන්වා දෙන ලද්දේ මෙවර ජනාධිපතිවරණයේදීය. ඔවුන් එම තේරීම කළේ ඉදිරියට ඉන් ලැබෙන ප්‍රතිඵලවලත් වගකීම් දරාගෙන දැයි අපි නොදනිමු.

මෙවර ජනාධිපතිවරණයේ පතුලේ තිබුණේ ඇත්තටම ගත් කළ ජාතිවාදී යුද්ධයකි. නව ජනාධිපතිවරයා දිවුරුම් දුන්නේද යුද්ධයෙන් බෙදන්නට බැරි වූ රට, ඡන්දයෙන් බෙදා වෙන්කොට බව කිවහොත් එය වඩා නිවැරදිය. දුටුගැමුණු ප්‍රතිමාව අභියස සිට ඔහු කළ කථාවෙන් ඔහු තනිකරම ආමන්ත්‍රණය කළේ සිංහල බෞද්ධ ආධ්‍යාත්මයටය. තමා දුටගැමුණු පරම්පරාවේ කෙනෙක් බව හඟවමින් ඔහු කළ කථාවෙන් රටේ දෙමළ, මුස්ලිම් ජනතාවටද ජාත්‍යන්තර ප්‍රජාවටද දුන්නේ ඉතාම නරක සංඥාවකි. තමා මුළු රටේම නායකයා නොව දකුණේ සිංහල, බෞද්ධ ජනතාවගේ නායකයා පමණක් යන්න එම කථාවේ අනියමින් ගම්‍ය විය. එය රටට කොතරම් නරක ප්‍රතිඵල ගෙන දෙනු ඇත්දැයි ඉදිරියේදී දැකබලා ගත හැකි වනු ඇත. මේ ජයග්‍රහණයෙන් උද්දාමයට පමණක් පත්නොවී උන්මත්තකභාවයටද පත්වූ රාජපක්ෂලාගේ පරිවාර සේනා එම උදාවන තත්වයේ වගකීම ගනු ඇත්ද?

මෙය තනිකරම බිය සහ ජාතිවාදය මිශ්‍ර වූ ඡන්දයකි. ඡන්ද ප්‍රතිඵලය තුළ එය වඩා හොඳින් ඉස්මතු වේ. එ.ජා.ප. - ශ්‍රී.ල.පො.පෙ. පාර්ශ්ව දෙකම එම නිර්ලජ්ජිත, අශිෂ්ට සූදුවේ නග්න ලෙස යෙදුණි. රටක පුරවැසියා යන අර්ථය ලැබීමට නම් ඔහු වගකීම් සහගත මිනිසෙකු විය යුතුය. එසේ වීමට නම් ඔහු වසන සමාජය දියුණු එකක් විය යුතුය. එහෙත් යම් රටක පුරවැසියා ප්‍රයිවට් බස්වලට සෙනඟ පටවන ලෝඩර් කෙනෙකු සේ හැසිරේ නම්..! ඉතිරිය සිතා ගැනීම ඔබට භාරය.

# කොරහත් බිඳගෙනම ගිය යකා...

උද්ධච්ඡකමත්, මෝඩකමත්, කපටිකමත්, බොරුවත් මේ සියල්ල එකට කැටිකරගත් ජනාධිපතිවරයෙකු ලැබීමේ භාග්‍යය මේ රටේ ජනයා 2015 සිට 2019 දක්වා හිමිකර ගත්තෝය. ඔහු බලය ගත්තේ අපරාධකරුවන්, දූෂිතයන් එල්ලා දමන බවට දස අතේ පොරොන්දු දීය. ඒ සඳහා වැලිකඩ බන්ධනාගාරයේ පිහිටි පෝරකයට අලුතින්ම කඹයක්ද ආනයනය කරන ලදී. එහෙත් ඔහු විශ්‍රාම ගියේ තම පෙම්වතිය මරාදමා මහපොළොව නුහුසුලන අපරාධයක් කර, පෝරකයට නියම වූ අපරාධකරුවෙක් වූ රෝයල් පාර්ක් ඝාතකයාට ජනාධිපති සමාව දෙමිනි. ඔහුගේ අවසන් 'සද්ක්‍රියාව' එය විය. තමන් කියූ දේට මුළුමනින්ම පටහැණි දේ කරන තම පූර්වජයන්ගේ වර්ගයේම එකෙක් බවට සලකුණු තබමින් ඔහු නික්ම ගියේද ඔහුට මේ ආණ්ඩුවෙන් ලබාදුන් කොළඹ පිහිටි රුපියල් කෝටි ගණනක් වටිනා මාලිගාව වෙතය. ඒ විතරක් නොව බද්ද පමණක් කෝටි 15කට වැඩිවූ අලුතින්ම රටින් ගෙන්වා දෙන ලද අති සුඛෝපභෝගී රථද පිරිවරාගෙනය. විශ්‍රාම ගිය පසු තමන් පොළොන්නරුවේ මහගෙදරට වී කුඹුරු කොටනවා යැයි පැවසූ මෛත්‍රීපාල ජනාධිපති අද කොළඹ අති සුඛෝපභෝගී මාලිගාවක උද්‍යානයේ විවේකීව කල් ගෙවමින් ඉතා සැහැල්ලුවෙන් පුවත්පතක් බලන අන්දම පසුගියදා පත්තරවල ඡායාරූපද සහිතව මුල් පිටුවේම පළවී තිබුණි.

ඔහුගේ ආරම්භක වචනය වූයේ අපරාධකරුවන්ට දඬුවම් දීමය. නමුත් අපරාධකරුවන් සමග වූ 'ඩීල්වල' අවසන් ක්‍රියාව වූයේ රටේ ම්ලේච්ඡ අපරාධකරුවෙකු මරණ දණ්ඩයෙන් නිදහස් කොට ජනාධිපති සමාව දීමය. මේ ජඩ දේශපාලන සූදුව නොදැක්කා සේ සිට කිරිබත් කෑ හැක්කේ කුමන රටක කුමන වර්ගයේ මිනිසුන්ටද? අපි ඔබෙන් අසමු.



# පොලිටිකල් පංතිය

ඡන්දෙන් දවස් ගණකට පස්සෙ පොලිටික්ක පංතියට ආවෙ හිනා කටයි මල් දෙකටයි දාගෙන. ළමයි පොලිටික්ක පංතියට ඇතුල් වෙනකොටම නැගිට්ටා. පොලිටික්ක හිතන් හිටියෙ 'වෙරි ගුඩ් මෝනිං, ළමයිනේ, ජය වේවා' කියල පංතියට ඇතුල් වෙන්න. ඒත් ඊට පස්සෙ ආපු ප්‍රතිචාරෙන් පොලිටික්ක අන්දුන් කුන්දුන්. අනුරුද්ධියයි, වසන්තියයි ඇරෙන්න හැමොම වගේ දකුණු කකුල උස්සල සද්දෙට බිම ගහල සැලියුට් කළා. සද්දෙ වැඩිකමට අල්ලපු පංතියෙ හිටපු හිස්ටීරියාවත් එබිල පොලිටික්කට නොන්ඩි බැල්මක් දැම්ම. ඒ වෙලාවෙ කවුරුහරි පොලිටික්කව දැක්කනම් එවෙලෙ ගොඩ දාපු මාළුවෙක් බලා ගන්න තිබුණ.

"මොකද්ද ළමයිනේ මේ කුණුහරුපෙ?" පොලිටික්ක ටිකාක් විතර සිහිඑළඹ ගෙන ඇහුවා.

"ඇයි සර් අවුලක්ද?" මංජුවා ඔළුව කැහුවා. "අපි හිතුවෙ අලුත් ක්‍රමේට හරි යන්නෙ..."

"මොකක්ද ඒ කරපු වැඩේ අල්ලපු පංතියටත් එක්ක ඩිස්ටර්බ්" පොලිටික්කගේ ලොකුම හිසරදේ හිස්ටීරියාව දැකපු එකට.

"ඇයි සර්... අපි සැලියුට් එකක්නෙ ගැහුවෙ" සද්දෙට අඩ නින්දෙන් ඇහැරුණු කනියත් කලින් කතා වෙච්ච දේට අලගු තියනව.

"හරි මොකක්ද හේතුව සැලියුට් ගහන්න?" පොලිටික්ක සටන් විරාමයක් ප්‍රකාශයට පත් කළා.

"හේතු කීපයක් තිබ්බ සර්" මංජුව රූපවාහිනී විවාදෙක වගේ. "...අලුත් ජනාධිපති හමුදාවෙ හිටියනෙ. ආරක්ෂක ලේකමුත් හමුදාවෙ. දැන් ගැසට් එකෙන් හමුදාවට සිවිල් බලතලත් දීල.... අනික මොනව නැතත් ජාතික ආරක්ෂාවට මුල් තැන දෙන්න එපායෑ"

"ඔය ළමයි හිතලා තියෙන දුර. ඔය ගොල්ලන්ට බය හිතුණද?" පොලිටික්ක ඉලාස්ටික් හිනාවක් දැම්ම. "ඔය ළමයි ත්‍රස්තවාදියොයෑ..."

"අපි නම් බය නෑ සර්. ඒත් නිදහස් මිනිස්සු, නිදහසේ ජීවත් වෙලා, නිදහසේ මැරෙන්න කැමතියිනෙ. අඩුම ගාණෙ තමන් මැරෙන විදිය වෙන කෙනෙකුට තෝරන්න දෙන්න කැමති නෑනෙ" සමන පොලිටික්කට දැම්මෙ දුස්රාවක්.

"මොකද්ද සමන් මේ කියන්නෙ? මිනිස්සු ඔක්කොටොම වඩා තමන්ගෙ නිදහස ගැන හිතුව. බෝම්බ පුපුරන්නෙ නැතිව, බියක් සැකක් නැතුව ඉන්න පුළුවන් රටක් ගැන හිතුව. ඒකයි... ඒකයි ඒ මිනිස්සු මහින්ද මහත්තයට ඡන්දෙ දුන්නෙ..." පොලිටික්කගෙ ටැපලීමට කට්ටියට හිනා ගියා.

"සර් ඇත්තටම හිතන්නෙ මිනිස්සු ඡන්දෙ දුන්නෙ ගෝඨාභයටද නැත්නම් මහින්ද කියල හිතාගෙන ගෝඨාභයටද?" කනිය වංගු නැතුව කෙලින්ම ප්‍රශ්නෙකට ගියා.

"ඇයි ළමයිනේ එහෙම ඇහුවෙ" කඩඉම් ප්‍රශ්නෙන් පොලිටික්ක කරකෝලා අතෑරිය.

"නෑ සර්ම කිවුව නිසා ඇහුවෙ, මිනිස්සු මහින්ද මහත්තයටයි ඡන්දෙ දුන්නෙ කියපු නිසා. එහෙම කිවුවොත් හැබැයි, ගෝඨාභය මහත්තයත් පොල් ලෙල්ලක් වෙනවා" මංජුව බේරෙන්න දෙන්නෙම නෑ.

"නෑ ළමයිනේ මට එහෙම කියවුණේ පුරුද්දට. මිනිස්සු මිනිස්සු ඡන්දෙ දුන්නෙ ගෝඨාභය මහත්තයට තමයි" පොලිටික්ක වැරැද්ද හදන්න ගියා.

"ඔය පුරුද්දට ගිහින් තමයි මිනිස්සු මේ පක්ෂ දෙකටම ඡන්දෙ දෙන්නෙ... වැඩකට නෙමෙයි. ඉන්නෙ හොරු කියලත් දන්නව. ඒත් ජන්මෙට වඩා දරුණු පුරුද්දක් තියෙන්නෙ. අලුත් අලුත් කිය කිය පරණ ආණ්ඩු එක්ක දුවනවා..." සමන හීනියට පටන් ගත්ත. "දැන් බලන්න ආණ්ඩුවෙ වියදම් අඩුකරනව කියල තාවකාලික ආණ්ඩුවටත් ජම්බො ඇමති මණ්ඩලයක් දානව. ජනාධිපති වෙලා හැරෙන තැපෑලෙන් කටුගේ නඩුවෙන් නිදහස් වුණා. ෆයිල් හොයන්න සීඅයිඩී එකට පොලීසියෙන් පනිනවා. වංචා දූෂණ හොයපු රහස් පොලීසියෙ ලොක්කා චූදිතයෙක් වෙලා. දැන් ඝාතන ගැන, වංචා ගැන හොයපු පොලිස් නිලධාරීන්ට ජීවිතේ බේරගන්න රටෙන් පනින්න වෙලා. රටින් පැන්නෙ කොහොමද කියල හොයන්න ස්විස් තානාපති කාර්යාලෙ වැඩ කරපු කෙනෙක් සුදු වෑන් එකෙන් එකෙන් උස්සනවා. අපරාදෙ කියන්න බෑ වැඩේ බාර දීපු කට්ටිය ආණ්ඩුව නාවන්නම වැඩේ කරලා. දැන් එහෙන් පරීක්ෂණේකුත් ඉල්ලලා... බල සුබ නිමිති පෙරමඟ නැකතටත් වැඩී කිවුවලු..." සමන කිවුව සැර වැඩිද මන්දා මූඩ් බැහැපු පොලිටික්ක මොනව කියන්නද වගේ වටපිට බලන එකෙන් තේරුණා.

## පැරණි අර්බුද මත... 03 පිටුවෙන්



විට, ඒ තුළ යහපත් ආණ්ඩුකරණය යන්න විහිළුවක් වේ. දැන් සිටම තම පැරණි නඩු ඉවත්කර ගැනීම, තමන් පිළිබඳ පරීක්ෂණ මෙහෙයවූ පොලිස් නිලධාරීන්ගෙන් පළිගැනීම, ආරම්භ වී තිබේ. අලුතින් හොරකම් කිරීම ඇරඹෙන්නේ මහ මැතිවරණයෙන් ආණ්ඩුවක් පිහිටුවා ඇමති මණ්ඩලය පත්කර බලය ස්ථාවර කරගත් පසුවය. එබැවින් ආණ්ඩුවේ 'හොඳ ළමයා'ගේ කාලය කෙටි එකකි. ඇමති තනතුරු ප්‍රමාණය තිහට සීමාවී වීමක් ජනතාව අපේක්ෂා කළද මේ වන විටද නියෝජ්‍ය හා රාජ්‍ය අමාත්‍ය ධුර සමග සමස්ත ඇමති මණ්ඩලය 55කට ආසන්න වී තිබේ. මෙය තවත් ඉහළ යාමටද ඉඩ ඇත. මැතිවරණය අබියස සියලු දෙනා සතුටු කරලීම සඳහා ඔවුන් එය වැඩිකර ගත යුතුය. නැති නම් ඇමති ධුර නොලැබීමේ ඇතිවන ප්‍රශ්නවලට මුහුණ දිය යුතුය.

මේ සියල්ල දෙස බලන විට සත්‍ය ලෙසම අලුත් නැති 'අලුත් ආණ්ඩුවක්' පැරණි මඟේම ගමන් කරනවා ඇත. එහිදී ජනතාව පීඩාවට පත්වීම නොවැළැක්විය හැකි වනු ඇත. එවිට ජනතාවට තමන් වෙනුවෙන් සටන් වදින දේශපාලන බලවේගයක් හා ප්‍රබල විපක්ෂයක් අවශ්‍ය වේ. ඉදිරි දේශපාලනයේ ප්‍රබල විපක්ෂයේ කාර්යය ඉටුකළ හැකි වන්නේ මුදලට විකිණීමට බලාපොරොත්තුව සිටින එ.ජා.ප.යට නොව ජාතික ජන බලවේගයටය. එබැවින් ජාතික ජන බලවේගය දැන් කළ යුත්තේ ඉදිරි මහ මැතිවරණයේදී ප්‍රබල විපක්ෂයේ භූමිකාව ඉල්ලා සටන් වැදීමය. ලාංකේය දේශපාලන දේහය තුළ මේ මොහොතේ ඒ සඳහා විෂයමූලික ඉඩක් තිබෙන බව පැහැදිලිය.

## 2019 ජනාධිපතිවරණය... 07 පිටුවෙන්

පසුබෑම් තිබෙනවා. එය දේශපාලනයේදී තේරුම්ගත හැකි එකක්. එමනිසා වර්ධනයන් මගේ ජයග්‍රහණයක් ලෙස හෝ පසුබෑම් මගේ පරාජයක් ලෙස නෙවෙයි ගන්නේ. අපි දේශපාලන ව්‍යාපාරයක්. එම ව්‍යාපාරයේ අපිට පැවරුණ වගකීම් තිබෙනවා. එම වගකීම් තමයි අපි සමාලෝචනය කර ගන්නේ. අපේ දේශපාලන ව්‍යාපාරය ඇතුලේ මා අපේක්ෂකයා ලෙස තෝරාගැනීමට අදාළ වගකීම මම ඉටු කළා යැයි විශ්වාසයක් තිබෙනවා. ඒ වගේම අපේ ව්‍යාපාරයටත් ඒ විශ්වාසය තිබෙනවා. ප්‍රතිඵලවලට විවිධ අර්ථකථනයන් දෙන්න උත්සහ කරනවා. ඒවාට අපි යටත් වෙන්නේ නැහැ.

**දින 52දේ ක්‍රියාවලියේදී ඔබලාගේ හැසිරීම ප්‍රතිඵලයට බලපෑමක් වෙලා නැද්ද?**

එම ප්‍රශ්නයෙන්ම පේනවා මාධ්‍ය අපිට එරෙහිව හදන්න උත්සහ කරන මතය කොයිතරම් ප්‍රබලද කියලා. එතන තිබුණේ අගමැති ධුරය කා අතේද තිබෙන්නේ කියන ප්‍රශ්නය නෙවෙයි. ජනාධිපතිවරයාට වැඩ කළ හැකි රාමුවක් ව්‍යවස්ථාවෙන් හදල දීලා තිබෙනවා. එයින් පිට පනින්න ඔහුට බැහැ. අපේ අභිප්‍රාය වුණේ ජනාධිපති ව්‍යවස්ථාව ඇතුලේ හිර කර ගැනීම. අපේ ස්ථාවරය අධිකරණයේ විනිසුරුවරුන් 07 දෙනෙකු ඒකමතිකව තීන්දු කර තිබෙනවා. අපි දේශපාලනය මනින්නේ කාටද වාසි වෙන්නේ අවාසි වෙන්නේ කියලා නෙවෙයි. සමහරු එහෙමයි. තමන්ට වාසි නම් ව්‍යවස්ථාව කඩන පැත්තේ. තමන් අවාසි නම් අනෙක් පැත්තේ. අපි හෙටත් කවුරු හරි ව්‍යවස්ථාවට එරෙහිව කටයුතු කරනවානම් ඊට එරෙහිව අපි පෙනී ඉන්නවා. එය ඉදිරියේදී ගෝඨාභයට වාසිද අවාසිද කියලා අපි බලන්නේ නැහැ.

ප්‍රතිවාදීන්ගේ තර්ක බිඳ වැටෙනවා ජනාධිපතිවරණයෙන්. ජනාධිපතිවරණයේදී අපේ තීරණය කොයිතරම් ප්‍රබලද කියනවානම් එජාපයට සහය දෙන පිරිස් අපිට කිවුවා ජාතික ජන බලවේගයට ඡන්දය දීම ගෝඨාභයට ඡන්දය දීම හා සමානයි කියලා. අපි දේශපාලනය කරන්නේ මේ භූමියේ. අපි ගන්න සියලු දේශපාලන තීන්දු තීරණ කවර හෝ දේශපාලන කඳවුරකට ඍජුව හෝ වක්‍රව බලපෑම් කරනවා. එහෙම නම් අපිට දේශපාලනය කරන්න වෙන්නේ වෙනත් ග්‍රහ ලෝකයක. අපි බලන්නේ දේශපාලන තීන්දුව හරිද වැරදිද කියලා. ඔක්තෝබර් 26 තීරණයත් ජනාධිපතිවරණයේදී අපි ගත් තීරණයත් හරි කියලා අපි විශ්වාස කරනවා.

**පාර්ලිමේන්තුව විසුරුවන්න යෝජනාවක් ගෙනාවොත් ඔබතුමාලා මොකද කරන්නේ?**

මෙය පාර්ලිමේන්තුව තුළ බල හුවමාරුවක් නෙවෙයි. මේ ජනතාව විසින් ලබාදුන් කැමැත්ත. මේ බල හුවමාරුවට අපි එකඟ විය යුතුයි. පාර්ලිමේන්තුව ජන වරමකට යනවද නැද්ද කියලා අපි සාකච්ඡා කර බැලිය යුතුයි.

## කණ්ඩායම් දෙකම... 12 පිටුවෙන්

එක එක විදේශීය බලවතුන්ගේ සරණ යන්නේ කොහොමද? ඔවුන්ගේ උදව් ගන්නේ කොහොමද? ඔවුන්ගේ උදව්වෙන් තමන්ට ආණ්ඩු හදාගන්නේ කොහොමද? ආණ්ඩු හදා ගත්තට පස්සේ ඒ ඒ රටවල සැලසුම්වලට අනුව කටයුතු කරන්නේ කොහොමද? කියන එක ගැන මේ කණ්ඩායම් දෙකෙන්ම උදාහරණ සපයලා තිබෙනවා.

විදේශ බලවතුන්ගේ සාක්කුවට වැටිලා ඉන්න අපේ රටේ මේ කල්ලි දෙකෙන් කට්ටියක් ඉහත ගිවිසුම ආරක්ෂා කරන්නටත්, අනෙක් කට්ටිය ඊට එරෙහිව මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් එල්ල කරන්න වගේ කටයුතු කරමින් ඉන්නවා. මේ නිසා අපි මේ ගැන රටට කරුණු පැහැදිලි කරදිය යුතු යැයි අදහස් කළා. 2000න් පස්සේ ලංකාව විශාල වශයෙන් විවිධ ගිවිසුම්වලට ගිහිල්ලා තිබෙනවා. ජාතික ජන බලවේගයේ අපි විවිධ රටවල් සමග, ආයතන සමග, අත්සන් කරන හැම ගිවිසුමකටම ඉවක් බවක් නැතිව විරුද්ධ වෙන්නේ නැහැ. නමුත් එම ගිවිසුම්වලට රට යා යුත්තේ පළමුව හොඳ අධ්‍යයනයකින්. අනෙක ලංකාවට වාසි ලැබේද, නැද්ද, සොයා බලලා. ඊළඟට රටේ ජනතාවට එම ගිවිසුම්වල අඩංගුව හෙළිකළ යුතුයි. ඊළඟට ඒ ගිවිසුම් ගැන රාජ්‍ය ආයතන සමගත්, ජනතාව සමගත් ක්‍රමවත් සාකච්ඡාවක් කළ යුතුයි. ඊට පස්සෙ තමයි ගිවිසුම් ගැන තීරණ ගත යුත්තේ කියලයි අපි විශ්වාස කරන්නේ.

මෙම ගිවිසුම අලුත් කිරීම සඳහා තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ කියන්නේ 2018 සැප්තැම්බර් 24 වැනිදා ඇමරිකානු තානාපති කාර්යාලයෙන් මේ ගිවිසුම අලුත් කිරීම සඳහා ආණ්ඩුවෙන් ලිඛිත ඉල්ලීමක් කර තිබෙනවා. එයින් ඔවුන් ඉල්ලා සිටිනවා ඇමරිකානු හමුදා භටයන්ට පමණක් නොවෙයි, ඔවුන්ට විවිධ සේවා සපයන පුද්ගලයන්ට, කොන්ත්‍රාත්කරුවන්ටත් ලංකාවට නිදැල්ලේ එන්න යන්න හා ඔවුන්ව කිසිදු පරීක්ෂාවකට ලක් නොකිරීමටත්. ඒ වගේම ඇමරිකන් හමුදා භටයෙකුට මෙරට කෙනෙකුගෙන් අපරාධයක් සිද්ධ වුණොත් ඊට අදාළ නඩු කටයතු ඇමරිකානු නීතිය අනුව කළ යුතුයි කියලා. පරිච්ඡේද 15ක යෝජනාවලියක් මෙහිදී ඉදිරිපත් කරලා තිබෙනවා. මේ ගිවිසුම මේ එ.ජා.ප. ආණ්ඩුව ප්‍රතික්ෂේප කරලා නැහැ. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත් එහෙම කරලා නැහැ. ගෝඨාභය රාජපක්ෂ මහතාත් මේ ගිවිසුම ප්‍රතික්ෂේප කරලා නැහැ. මහින්ද රාජපක්ෂ මහතාත් ප්‍රතික්ෂේප කරලා නැහැ.

ගෝඨාභය රාජපක්ෂ මහතාද අත්සන් කළ ගිවිසුමක් තමයි 'ඇක්සා-1' පළමුවෙනි ගිවිසුම. ගිවිසුම අත්සන් කළ එක්කෙනෙක් ඇමෙරිකානු තානාපති රොබට් ඕ බ්ලේක් අනෙක් කෙනා එවකට ආරක්ෂක ඇමති ගෝඨාභය රාජපක්ෂ. 2007 මාර්තු 05 අත්සන් කළේ. මෙහි විශේෂත්වය තමයි ඇමෙරිකානු හමුදාවට යුද ආධාර සපයන මෙවන් ගිවිසුමක් දකුණු ආසියාවේ ප්‍රථම වතාවට අත්සන් කරන්නේ ලංකාවේ. මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපතිවෙලා ඉන්නකොට තමයි, මෙය අත්සන් කළේ. ඇමෙරිකන් පුරවැසියෙකු වූ ගෝඨාභය මෙම ගිවිසුම කැබිනට් මණ්ඩලයටත් නොදන්වා ඊට හොරෙන් තමයි මේක අත්සන් කළේ. මේ ගිවිසුමට ඔය රාජපක්ෂලා කොතනද විරුද්ධව කථා කරලා තිබෙන්නේ.

ඊළඟට අවුරුදු දහයකට පස්සේ 'ඇක්සා-2' ගිවිසුම ගැහැව්වා, 2017 අගෝස්තු 04 වැනිදා මෛත්‍රී-රනිල් දෙදෙනාගේම අනුමැතිය ඇතුව. ඇමෙරිකානු තානාපති සහ එවකට සිටි රාජ්‍ය ලේකම් තමයි මේකට අත්සන් කළේ. එතකොට එහිදී රාජපක්ෂලා මොකද කළේ. ගෝඨාභය රාජපක්ෂ ගැසූ ගිවිසුමේ සියලු කරුණු මේ ගිවිසුමෙත් තිබෙනවා. එකම දේ ගිවිසුමට කාලසීමාවක් නොමැතිවීම. අනන්තය දක්වා දිගයි. මේකට රාජපක්ෂලා කිසිදු විරෝධතාවක් දක්වලා නැහැ.

2019 ලංකා ආණ්ඩුව, චීනයත් සමග ආරක්ෂක ගිවිසුම් දෙකක් අත්සන් කරනවා, පාස්කු ප්‍රහාරයෙන් පස්සේ. මේකට අනුව චීනය තමයි ලංකාව යුදමය සන්නිවේදන කටයුතුවලට අවශ්‍ය යටිතල පහසුකම් සපයන්නේ. එ.ජා.ප. ආණ්ඩුවේ මේ පාවාදීම් සහිත ගිවිසුම් ගැන ගෝඨාභය හෝ මහින්ද රාජපක්ෂ කියන්නේ මොනවාද? ඊළඟට මේ ආණ්ඩුව කොළඹ වරායේ නැගෙනහිර ජැටිය, ඉන්දියාවට සහ ජපානයට බදුදීමට කැබිනට් පත්‍රිකාවක් දමා ගිවිසුමක් ඉදිරිපත් කරනවා. මේකට විරුද්ධව රාජපක්ෂලා මොනවාද කිව්වේ කළේ? රාජපක්ෂලාගේ හා රනිල්ලාගේ, සජිත්ලාගේ සැබෑ භාවිතය තමයි මේ ගිවිසුම් පහ පදනම් කරගන අපි ඉදිරිපත් කළේ."

## නවෝත්පාදන ක්‍රියාවලියට... 02 පිටුවෙන්



අන්තර්ජාලයට මුදා හැරියාට පස්සේ, ඒ මෘදුකාංගයේ අයිතිකරු කවුද කියලා සොයන්නේ නැහැ; ඒකේ අයිතිකරුගේ රට ලොකුද, පොඩිද කියලා සොයන්නේ නැහැ; ඔහු සිටින්නේ යුරෝපයේ රටකද, අරාබි රටකද, අප්‍රිකානු රටකද කියලා සොයන්නේ නැහැ. ඒ තාක්ෂණය යොදා ගන්න අවශ්‍ය කෙනා ඒ තාක්ෂණය ගන්නවා. එතකොට වැදගත් වෙන්නේ එය සොයා ගැනීමයි. ඒ නව නිෂ්පාදනය, ඒ නවෝත්පාදනය තිබෙන රට ලෝකයේ එයට හිමි පේටන්ට් හිමිකාරිත්වය ලබනවා. ඒ නිසා විශේෂයෙන්ම මෙවැනි ජාතික ආයතනයක් රටේ පවතින එක අතිශය වැදගත් වෙනවා. මේ පනත මගින් නිර්මාණය කරන සභාවට අපි යෝජනා කරන්නේ, මුළු ලංකාව පුරා ඉන්න, සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ යන සියලු ජනතාවගේ දරුවන් අතරේ සිටින තාක්ෂණික හැකියාව තිබෙන, නවෝත්පාදන හැකියාව තිබෙන අය පිළිබඳ දත්ත අඩංගු database එක හරිහැටි හදන්න කියලායි. මොකද, තොරතුරු නැතුව, දත්ත නැතුව මොනවත් කරන්න බැරි නිසා.

අද වගා කරන කෙනා ඉබාගාතේ වගා කරනවා. දෙහි වගා කරන කෙනා දෙහි තිබන කාලයට ඇති වෙන්න දෙහි වගා කරනවා. හැබැයි දෙහිවලින් ඊළඟට කරන්නේ මොකක්ද කියලා කවුරුවත් දන්නේ නැහැ. මම පුංචි උදාහරණයක් කියන්නම්. පසුගිය දවසක මාතර, දෙයියන්දර, මුලටියන ප්‍රදේශයේ කුරුඳු වගා කරන අය හමුවෙලා මම ඇහුවා, "කුරුඳු වගා කරලා හදන්නේ මොනවාද?" කියලා. ඒ අය දන්නේ, "කුරුඳු වගා කරලා හදන්නේ කුරුඳු විතරයි" කියාලායි. කුරුඳු කියන්නේ අමුද්‍රව්‍යයක්. උදාහරණයක් වශයෙන් කිව්වොත්, ලෑලිවලින් පුටු හදනවානේ. පුටුව නිෂ්පාදනයක් වෙන කොට ලෑලි අමුද්‍රව්‍යයක් වෙනවා නේ. නමුත් මෙහිදී කුරුඳුවලින් ටොෆියක් නිෂ්පාදනය කරන්න, සුවඳ විලවුන් perfume නිෂ්පාදනය කරන්න, කුළුබඩු නිෂ්පදනය කරන්න, biscuit නිෂ්පාදනය කරන්න, toothpaste එකක් නිෂ්පාදනය කරන්න, අඩු තරමින් කුරුඳු ලීයෙන් toothpick එකක් නිෂ්පාදනය කරන්න පුළුවන් කියන දැනුම ඒ ගොල්ලන්ට නැහැ. ඒ ගොල්ලන්ට ඒ ගැන හිතෙන්නේ නැහැ. මොකද, ඒ ගොල්ලෝ දන්නේ කුරුඳු වවන්නයි. කුරුඳු තලලා, කරුඳු ටික මිටි බැඳලා, රට පැටෙව්වාම ඔක්කෝම හරි කියලා හිතනවා. හැබැයි ඒ නිෂ්පාදන සඳහා නවීන තාක්ෂණය ගමට ගෙනයනත් ඕනෑ. එය ගමට ගෙනයන්න වෙන්නේ මේ නවෝත්පාදන ක්‍රියාවලියට අපේ සමාජය එකතු කර ගත්තොත් විතරයි.

## ක්‍රීඩා පරිපාලනය දූෂිත වෙන්නේ...



සියයට 90ක් වැරදි නම්, සියලු ක්‍රිකට් ක්‍රීඩකයන් නොවුණත්, ක්‍රිකට් ක්‍රීඩකයන්ගේත් සියයට 10ක් විතර දායකත්වයක් ඒවාට තිබෙනවා. අපි ඒ කාරණය වහලා කථා කරන්න අවශ්‍ය නැහැ. මොකද, ඕනෑම තැනක මුදුන දූෂිත වුණාම ඊට පහළත් ඒ වාගේ පිරිසක් හැදෙනවා. ඒ නිසා මම විශේෂයෙන්ම ක්‍රීඩා ඇමතිතුමාට කියන්නේ, ඔට්ටු සූදුකාරයෝ අයින් කළාට විතරක් වැඩක් නැහැ කියන එකයි. එහෙම කරලා, මහ බැංකුව කඩපු අය ඒ තැන්වලට පත්වෙලා වැඩක් නැහැ; හැම ටෙන්ඩරයකින්ම වෙනම ගණනක් ගන්න කථා කරන අය පත්කරලා වැඩක් නැහැ.

මේ අවස්ථාවේදී නැවත අවධාරණය කරනවා. නීතිපති දෙපාර්තමේන්තුවේ ඍජු සම්බන්ධතාව COPE එකට අරගෙන දෙන්න කියලා. මේ අය කරන්නේ ජාතික අපරාධ, ලංකාවට ආඩම්බර වෙන්න ඉතුරුවෙලා තිබෙන්නේ ක්‍රිකට් වාගේ එකක් දෙකක් පමණයි. ඒවායින් හොරකම් කරන එක ගැන තමයි අපි මේ වාද විවාද කරන්නේ. COPE එකෙන් හදපු ඉතා විශිෂ්ට වාර්තාවක් තිබෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවේ පුද්ගලයන් ඒ සභාවේ ඉන්නවා නම්, මේ වැරදිවලට අදාළ ක්‍රියාමාර්ග ගන්න පුළුවන්.

ඒ වාගේම මෙම විවාදයට ඍජුව සම්බන්ධ නැති වුණත්, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. තරුණියක් ඝාතනය කිරීම සම්බන්ධයෙන් සිරගත කොට සිටි සිරකරුවෙක් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා විසින් මීට දිනකට දෙකකට පෙර ජනාධිපති සමාව යටතේ නිදහස් කළා. ඇත්තටම ගත්තොත් රටක් වශයෙන් අපි දකිනවා, මේ කාරණය විශාල වශයෙන් රටත්, නීතියේ ආධිපත්‍යයත්, අධිකරණයත් හෑල්ලුවට ලක්කරන බව. ඒ වාගෙ 'ම, මෙහිදි අපි ජාත්‍යන්තර වශයෙනුත් හුදෙකලා වීමකට ලක්වෙනවා. ඒ මරා දමන ලද ඒ තරුණිය ස්වීඩන් ජාතික තරුණියක්, ජනාධිපතිතුමා විසින් මේ ගන්නා ලද ක්‍රියාමාර්ගය නිසා අද අන්තර්ජාතික වශයෙන් ලංකාවට ඇතිදැවැන්ත අපකීර්තියක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ මරාදමන ලද තරුණියගේ නැගණිය විසින් ලියන ලද ලිපියක් අපේ රටේත් පුවත්පතක පළ වෙලා තිබෙනවා මම දැක්කා. ඇත්තටම එය කියවද්දී හදවත කඩාගෙන වැටෙනවා. අපට පැහැදිලි නැත්තේ, ජනාධිපතිවරයා මේක කළේ ඇයි කියන එක. එක්කෝ එතුමා මේ වනවිට මහින්ද රාජපක්ෂ මැතිතුමා සමග සන්ධානගත වෙලා සිටින නිසාද? අපි දන්නවා මහින්ද රාජපක්ෂ මැතිතුමන්ලා හුගදෙනෙකුට ජනාධිපති සමාව දුන්න බව. ඒ ඉල්ලීමක් මතද මේක කළේ? එහෙම නැත්නම්, මුදල් ගනුදෙනු ගැනත් ජනතාව කථා කරනවා. මොකද සමාව දෙනවා නම් කිසියම් ක්‍රමවේදයකට කෙරෙන්න ඕනෑනේ. සමාව දිය යුතු හුගක් දෙනෙක් සිටිනවා කියලා නීති ක්ෂේත්‍රයේත් කියනවා. එහෙම තිබියදී, ජනාධිපතිවරයා එල්ලුම් ගහ ක්‍රියාත්මක කරනවා කියලා ඇවිල්ලා, ඉතා තිරශ්චීන ලෙස ඝාතනය කරපු, එය කළ බවට සැකයෙන් තොරව ඔප්පු වෙච්ච වරදකරුවෙකු නිදහස් කරනවා. උසාවිවලින් shortcuts නඩු අහලා නොවෙයි, පිළිවෙළට නඩු අහලා, වැරදිකරු වෙච්ච කෙනෙකු ජනාධිපති නිදහස් කරනවා. ජනාධිපති මේ කරපු දේ එක්කෙනක්වත් හෙළා දැකලා තිබෙනවාද? අපේ අනුර දිසානායක සහෝදරයා මේ සම්බන්ධව පළ කළ මාධ්‍ය නිවේදනය මම හැන්සාඩ්ගත කිරීම සඳහා සභාගත කරනවා.

අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 94 පිටුවේත් සඳහන් කර තිබෙනවා, "අධිකරණයක් විසින් හෝ වෙනත් ව්‍යවස්ථාපිත අධිකාරියක් මගින් නියම කරන දඬුවමක් ලිහිල් කිරීමේ ජනාධිපතිවරයා සතු බලතල අහෝසි කළ යුතුයි" කියලා. අපි මේ ක්‍රියාව හෙළා දකිනවා. ජනාධිපතිතුමා සිදුකළ මේ ක්‍රියාව ඇත්තටම කාන්තාවන්ටත් එල්ල වූ ඉතාම තිරශ්චීන ප්‍රහාරයක්. මොකද, එවැනි අයෙකු අධිකරණයකින් වැරදිකරු කළාට පසුව, එසේ නිදහස් කරන්න ජනාධිපතිතුමාට තිබෙන සදාචාර අයිතිය මොකක් ද? නීතිමය වශයෙන් මොන මොනවා හෝ තිබෙන්න පුළුවන්. නමුත් මේක අන්තිම වැරදියි. එක්සත් ජාතික පක්ෂයේ ජේ.ආර්. ජයවර්ධනලා සහ මහින්ද රාජපක්ෂලා යනාදී සියලු දෙනා කළ දේ තමයි එතුමාත් කරලා තිබෙන්නේ. ඒ නිසා මේක වහාම නතර කළ යුතු දෙයක් කියන කාරණය අවධාරණය කරනවා.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com


## 30 වැනි ඉල් මහ විරු සමරුවෙන්...











## ඉල් මහ විරු සමරුව - ඉතාලිය...




### 2019.11.13 ගාල්ල සමෝදා ශාලාවේ පැවති 30වැනි ඉල් මහ විරු සමරුවෙන්

# සැබෑ දේශප්‍රේමීන් කවුද යන්න අපට පෙන්වා දුන්නේ ඉල් මහ විරුවන්

**ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක සහෝදරයා**



අපේ රටේ පහළවූ ශ්‍රේෂ්ඨම දේශපාලන මිනිසා විජේවීර සහෝදරයායි. ඔහුව ඝාතනය කරලා අදට අවුරුදු 30ක් වෙනවා. ඔහු සමග අපේ සහෝදර සහෝදරියන් දහස් ගණනක් එජාප ආණ්ඩුව විසින් ඝාතනය කළා. ඒ සහෝදරවරුන්ගේ මතකය හැමදාමත් අපේ හදවත් පතුලේ තැන්පතක් වෙලා තිබෙනවා. එදා ඉන්දියානු හමුදාව ඇවිල්ලා අපේ රට ආක්‍රමණය කළා. අද එවැනි ආකාරයේ ආක්‍රමණයක තර්ජනයක් නොවූවත් විවිධ වර්ගයේ තර්ජන අපේ රටට එල්ල වෙලා. එනිසා එදා තත්වයයි අද තත්වයයි කියලා වෙනසක් නැහැ. කොළඹ වරායේ වැදගත්ම කොටස්, හම්බන්තොට වරාය, ත්‍රිකුණාමලයේ තෙල් ටැංකිවලින් කිහිපයක් අද විදේශිකයන් අතේ. ත්‍රිමලය වරායටත් බලපෑම් එල්ල වෙලා. රටේ වැදගත් ආර්ථික මර්මස්ථාන රාශියක් විදේශිකයන් අතේ. මේ දෙගොල්ලම එකතුවෙලා කළේ රට විකුණන එකයි.

අපේ රට විදෙස් බලවතුන්ට යට කළ ගිවිසුම් ගණනාවක් මේ වෙනකොටත් අත්සන් කරලා. තවත් ගිවිසුම් අත්සන් කිරීමට කැසකවනවා. ඒ නිසා එදාටත් වඩා අපේ රටේ ස්වෛරීභාවය, ස්වාධීනත්වය අහෝසි වෙමින් තිබෙනවා. ජාතික සම්පත් බහුජාතික සමාගම්වලට පවරා දීලා. ඉඩම් විශාල ප්‍රමාණයක් රාජපක්ෂ පාලන සමයේ ඇමරිකානු සමාගම්වලට පවරා දුන්නා. කල්පිටිය දූපත් පවා වික්කා.

1988-89 අරගලය කියන්නේ රට පාලනය කළ පාලකයන්ගේ මර්දනයටත් විදේශ ආක්‍රමණයටත් එරෙහිව කරපු අරගලයක්. ඒ අරගලය වෙනත් ස්වරූපයකින් අද අපට කරන්න වෙලා තිබෙනවා. රට විකුණන අයම අද දේශප්‍රේමීන් යැයි කියා ගන්නවා. සැබෑ දේශප්‍රේමීන් කවුද යන්න අපට පෙන්වා දුන්නේ ඉල්මහ විරුවන්.

අපේ පක්ෂය, අපේ වෘත්තීය සමිති ව්‍යාපාරය මර්දනය කිරීමේ උත්සාහය අදටත් පාලකයන් විසින් අත්හැර නැහැ. වරාය පවරාදීමට එරෙහිව සටන් වැදුණු කම්කරුවන්ට රනිල්ලාගේ ආණ්ඩුව එලව එලවා පහර දීලා අතපය කඩා දැම්මා. ප්‍රජාතන්ත්‍රවාදය ගැන එදාට වඩා අරගලයක් අද අපට තිබෙනවා. අපේ රටේ ආර්ථික විනාශ වී හමාරයි. එය පෙරළා ජන ජීවිතයට පහර පිට පහර දෙමින් තිබෙනවා. එනිසා අද අරගලයේ අවශ්‍යතාව එදාටත් වඩා වැඩියි. මෙවැනි අවස්ථාවල අතපය හකුළාගෙන නොසිට ධෛර්යවන්තව සටන් වැදුණු මිනිස්සු තමයි ඉල් මහ විරුවන්. එවැනි අභිමානවත් අතීතයක් සහිත පක්ෂයක් අපි. අපි සමරන්නේ ඉල් මහ විරුවන්ගේ වීරත්වය පමණක් නෙමෙයි. ඔවුන්ගේ සියලු ගුණාංග අපේ ජීවිතවලටද ඇතුළත් කරගත යුතුයි.

රට පාලනය කළ සහ කරන මේ කඳවුරු දෙකම අද ඉතිහාසයේ දරුණුම කඩාවැටීමට ලක්වෙලා. එම පරිසරය ජනතාවට වාසිසහගතයි. මෙම උපරිමයෙන් වැහැරුණු මේ කඳවුරු දෙක පිළිබඳව තවදුරටත් කිසිදු බලපොරොත්තුවක් තබාගත යුතු නැහැ. එදා අපේ විරුවන් සටන් වැදුණේද මේ කඳවුරු දෙක රටට අත්කර දුන් විනාශයන්ට එරෙහිවයි. ඔවුන් අවසානයේ තම අමිල ජීවිත පවා පුද කළේ ජනතාව වෙනුවෙන්. ඔවුන්ගේ ජීවිතවලින් ගත හැකි හොඳම ආදර්ශ තවත් බොහෝ තිබෙනවා. වත්මන් පරපුරේ අපි එම ආදර්ශ අත්පත් කරගත යුතුයි. අපේ අවසන් අරමුණු ජයගන්න එය අත්‍යවශ්‍යමයි. ඒ වෙනුවෙන් සියලු දෙනාටම ධෛර්යවන්තව පෙරට එන්න කියලා අපි ආරාධනා කරනවා.

# රට අර්බුදයට ගෙන ගිය පාලක පංතියට එරෙහි එකම විකල්ප ව්‍යාපාරය අපයි

**ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා**



අපි කොතැන සිටියත් කොහොම හිටියත් අපේ පංති යුතුකම ඉටු කරන්න බැඳී සිටිනවා. ඒ සඳහා තමයි අපි මෙතැනට ඒකරාශී වුණේ. රෝහණ විජේවීර, උපතිස්ස ගමනායක ඇතුළු අපේ පංතිය වෙනුවෙන්, අපේ රට වෙනුවෙන් දිවි දුන් දහස් ගණනක විරුවන් සමරන්න තමයි අපි අද එකතු වෙලා ඉන්නේ. අද ජනතා විමුක්ති පෙරමුණ ජයග්‍රහණ රැසක් අත්පත් කරගත් මොහොතක් ගතකරමින් ඉන්නවා. ඒ සියලු ජයග්‍රහණයන්හි ගෞරවය එලෙසම ඉල් මහ විරුවන්ටත් හිමියි.

ඉතිහාසය ලියැවී ඇත්තේ හැම විටම සත්‍යය මතම පදනම් වී නොවෙයි. අධිපතියන්ගේ ජයග්‍රහණ තමයි ඉතිහාසයේ වැඩිපුර ලියවෙලා තියෙන්නේ. විමුක්තිය උදෙසා සටන් කළ සියලු මිනිසුන් අර අධිපතියන් විසින් නාමකරණය කළේ ද්‍රෝහීන් කියලයි. පුරන්අප්පු, කැප්පෙටිපොළ වැනි අතීත විරුවන්ටත් යටත්විජිත අධිපතියන් සැලකුවේ එහෙමයි. අපි අහනවා ප්‍රශ්නයක්. පුරන්අප්පුලා, කැප්පෙටිපොළලා මේ රටේ පාලකයන්ට වීරයන්නම් ඉන්දියානු ආක්‍රමණිකයාට එරෙහිව සටන් වැදුණු ඉල් මහ විරුවන් ද්‍රෝහීන් වෙන්නේ කොහොමද කියලා. අධිපතියන් ඉතිහාස පොත්වල වීරයන් වුණාට විමුක්තිය වෙනුවෙන් සටන් වැදුණු විරුවන් ජනතා හදවත්වල වීරයන්.

ලෝක දේශපාලන ඉතිහාසයේ මිනිස්සු සටන් කළේ එකම ආකාරයට නෙමෙයි. දැන් ආයුධවලින් සටන් කරන එක අතීතයට අයිතියි. අද අලුත් පරපුර සටන් කරන්නේ අදහස්වලින් කියලා කස්ත්‍රෝ කියලා තියෙනවා. මතවාදීව අපිත් එක්ක සටන් වදින්න සතුරා අද අසමත් වෙලා. ඒ නිසා අවලාදවලින් අපිට ගහන්න පටන් අරන්. සතුරාට අප සමග සටන් වදින්න මතවාදී විද්‍යාවක් නැහැ. 88-89 සිදුවීම් නිතර නිතර මතක් කරමින් අවලාද නගන්නේ ඒ නිසා. ඉන් ඔවුන් අරමුණු දෙකක් ඉටුකර ගැනීමට බලාපොරොත්තු වෙනවා. ජනතාව හා අප අතර සම්බන්ධය කැඩීම එකක්. අවලාදවලට උත්තර දෙන්න පොළඹවා අපේ කාලය කා දමා අපව හෙම්බත් කිරීම තමයි අනෙක් එක. අපි උත්තර දෙන්නෙ අත්‍යවශ්‍ය දේවලට පමණයි.

අද අපි දැවැන්ත මහජන ව්‍යාපාරයක් හදන්න පදනම දමා හමාරයි. මේ වෙනකොට ඒ සඳහා විද්වතුන්, කලාකරුවන් විවිධ ක්ෂේත්‍රවල වැඩකරන සංවිධාන, වමේ කණ්ඩායම්, තරුණ කණ්ඩායම් එකතු වී සිටිනවා. දැන් සතුරාට අපව හුදෙකලා කරන්න බැහැ. අද ප්‍රධාන දේශපාලන ධාරා දෙකටම එකම අභියෝගය අපි. ඒකම අපේ ජයග්‍රහණයක්. අපේ අනාගත ජයග්‍රහණය ස්ථිර බවට පූර්ව සංඥාවක්. අද රට අර්බුදයට ඇදගෙන ගිය අධිපති පාලක පංතියට එරෙහි එකම විකල්ප ව්‍යාපාරය අපයි. මේ සියලු දේවල්වල ගෞරවය ඉල් මහ විරුවන්ට හිමි විය යුතුයි.

# කණ්ඩායම් දෙකම ගිවිසුම ගැන කියන්නෙ ඩබල් ගේම් කථා

**ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික බිමල් රත්නායක සහෝදරයා**



එ.ජා.ප.ය සහ රාජපක්ෂ කණ්ඩායම 'මිලේනියම් චැලේන්ජ් කෝපරේෂන්' ගිවිසුම පිළිබඳව දෙබිඩි පිළිවෙතක් අනුගමනය කරන බව කී ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික බිමල් රත්නායක සහෝදරයා ජ.වි.පෙ. බිල්ලන් මවන පක්ෂයක් නොවන බවත් සත්‍ය කරුණු මත පිහිටා කටයුතු කරන ව්‍යාපාරයක් බවත් ජාතික ජන බලවේගය යනු සබුද්ධික දේශපාලන ව්‍යාපාරයක් බවත් අවධාරණය කළේය.

ඔහු මේ බව ප්‍රකාශ කළේ පසුගිය 05වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකට සහභාගි වෙමිනි. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ බිමල් රත්නායක සහෝදරයා මෙසේද පැවසීය.

"මිලේනියම් චැලේන්ජ් කෝපරේෂන් ගිවිසුම ගැන දැන් රටේ ලොකු සාකච්ඡාවක් තිබෙනවා. ආණ්ඩුව මේ ගිවිසුමේ හොඳ ගැන කථාකරන අතර, රාජපක්ෂ පක්ෂ කණ්ඩායම ඊට විරුද්ධ මතයකුත් ගොඩනගාගෙන යනවා.

එ.ජා.ප.යත්, රාජපක්ෂ කණ්ඩායමත් ගත්තම මේ දෙකම පැහැදිලිවම සමාන කණ්ඩායම් දෙකක්. මේ දෙකේ ප්‍රතිපත්ති, පුද්ගලයන්ගේ භාවිතාව මේවායේ ඇමරිකානු ගැති බවට හෝ චීන ඉන්දියා ගැති බවට ඇති තරම් උදාහරණ මේ රටේ ජනතාව දන්නවා. මේවා සමහර ජනමාධ්‍ය යොදාගෙන වසන් කරන්න හැදුවත් මේ කණ්ඩායම් දෙකම බලයට එන්න කලින් 11 වැනි පිටුවට





බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.